**2025 දෙසැම්බර් මාසයට අදාලව 2025.12.16 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.**

**දිනය** - 2025.12.16
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලාංකික ජනතාවගෙන් විශාල ප්‍රමාණයකගේ ජීවිත දේපල හානිවීම හා විශාල ජනතාවක් අවතැන්වී අසරණ වී ඇති බැවින් එම මියගිය ජනතාව වෙනුවෙන් නිවන්සුව ප්‍රාර්ථනා කිරීමට හා අවතැන් වූ අසරණ ජනතාව වෙනුවෙන් හදපිරි ශෝකය ප්‍රකාශ කිරීමට ගරු මන්ත්‍රී මණ්ඩලයට අවස්ථාවක් ලබා දෙන මෙන් **ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා** විසින් ගරු මූලාසනයෙන් ඉල්ලා සිටින ලදී.

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් විපතට පත්වූ ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලෙස මූලාසනය විසින් ගරු සභාවට දන්වා සිටින ලදී.

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.11.14 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.12.05 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා 2025.11.14 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් ප්‍රකාශ කිරීමේදී "2022 වර්ෂයේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු ද අයවැයට විරුද්ධව ඡන්දය ලබාදී **අයවැය පරාද වූ බවත්** " ලෙස දක්වා ඇත. නමුත් මෙම අයවැය පරාද වූ බවත් යන්න ඉවත් කර සංශෝධනය කරන ලෙස ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු මූලාසනය විසින් එම සංශෝධනයන් පිළිගැනීමට සභාව එකඟ වන්නේ දැයි විමසීය.

එම සංශෝධනයන්ට සභාව එකඟ වූ බැවින් සංශෝධිත වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ගරු මූලාසනය විසින් දන්වන ලදී.

සංශෝධන සහිත 2025.11.14 දින සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදු කළ අතර ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව සංශෝධන සහිත 2025.11.14 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

අනතුරුව මූලාසනය විසින් දිට්වා සුළි කුණාටුව හේතුවෙන් විපතටපත් ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමට ගරු මන්ත්‍රී මණ්ඩලයට අවස්ථාව ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය අදහස් දැක්වීම.</u>

වැගම කොට්ඨාසයේ කරගහවෙල බටහිර වසමේ දෙහිගල වතු යායේ ජනතාවට මෙම දිට්වා සුළි කුණාටුවෙන් විශාල බලපෑමක් සිදුවී ඇති බවත් මේ වනවිටත් එම ජනතාවට බිබිලට හෝ බදුලු පාරට යන දෙපසටම ගමන් කිරීමට නොහැකි ලෙස මාර්ග අවහිර වී ඇති බවත් මෙම වසමේම ප්‍රේමසිරි මහතාගේ නිවසට පස් වෙල්ලක් කඩා වැටීම නිසා එම නිවසද අහිමිවී ඇති බවත් ,මෙම ජනතාවගේ සුවදුක් බැලීමට හා ඒ අයට අවශ්‍ය ද්‍රව්‍යාධාර රැගෙන තමන්ද එම ප්‍රදේශයට ගිය බවත් පැවසීය. මාතෘ භූමියේ විපතටපත් ජනතාවට මෙන්ම වැගම වසමේ විපතට පත් ජනතාවට තම ශෝකය හා කණගාටුව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.</u>

තමාගේ කොටගම කොට්ඨාසයෙහි වසම් දෙකක ජනතාවට මෙම දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ව්‍යසනයට පත්වූ බවත් යල්කුඹුර කොට්ඨාසයේ නිවාස දෙකක් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වී ඇති බවත් අමුණුදෝව තානායම්ගම වසමෙහි ද නිවාස දෙකක් කඩා වැටී ඇති බවත් පැවසීය. තමාත් ග්‍රාම නිලධාරිතුමා හා ජනතා නියෝජිතයින් කිහිප දෙනෙකු එක්ව විපතට පත්වූ තම වසමෙහි සියළු නිවෙස් කරා ගොස් ඔවුන්ගේ දුක සැප සොයා බලා සහයෝගය ලබා දුන් බවත් අවතැන්වූ ජනතාව සඳහා අවතැන් කඳවුරක් ටැංගොඩ පන්සලේ ස්ථාපිත කර ඒ අයට අවශ්‍ය පහසුකම් සැළසූ බවත් පැවසීය. එසේම බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා , ගරු සභාපතිතුමා මෙම අපදාවට ලක්වූ නිවෙස් වෙත කැඳවා ගෙන ගිය බවත් ඒ අයට හැකි පමණින් උදව් උපකාර කළ බවත් දැනට ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් පැමිණ වාර්තා ලබා ගන්නා තෙක් පස් ඉවත් නොකරන ලෙස දන්වා ඇති නිවාස වල පස් ඉවත් නොකර ඇති බවත් අනෙකුත් සියළු ස්ථාන වලින් පස් ඉවත් කිරීම් කටයුතු සිදු කළ බවත් බිබිල ප්‍රාදේශීය සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රය යොදාගෙන මාර්ග අවහිරව තිබූ පස් ඉවත් කිරීම් කටයුතු සිදුකර මාර්ග යථාතත්වයට පත් කළ බවත් අඩාලව තිබූ ජල සම්පාදන කටයුතු එක් දිනක් තුළ යථා තත්වයට පත් කිරීමට සියළු දෙනා එක්ව කටයුතු කළ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා විපතට පත්වූ සියළු ජනතාව සඳහා ශෝකය හා කණගාටුව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා අදහස් දැක්වීම.</u>

දිට්වා සුළි කුණාටුවෙන් රදලියද්ද වසමේ නිවාස හතරකට සුළු අනතුරු සිදුවූ බවත් තමන් එම ස්ථාන වලට ගොස් ඒ අයගේ සුවදුක් විමසා බැලූ බවත් ගරු පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා ද මෙම ස්ථානවලට ගොස් සොයා බැලූ බවත් පැවසීය. ඉලුකාපතන හා කණවේගල්ල ප්‍රදේශයේද නිවාස දෙකකට ජල ගැලීම් සිදුවී ඇති බවත් මේ සියළුම ජනතාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබියයුතු ආහාරපාන ටෙන්ට් ආදිය ලබා දීමට කටයුතු කළ බවත් විපතටපත් සියළු ජනතාව සඳහා තමාත් රදලියද්ද කොට්ඨාසයේ ජනතාවත් වෙනුවෙන් ශෝකය හා කණගාටුව ප්‍රකාශ කරන ලදී. මහියංගන ප්‍රදේශයේ විපතට පත් ජනතාව සඳහා උදව් උපකාර කිරීමට එම ප්‍රදේශයට ගිය බවත් බිබිල ප්‍රදේශයේ විපතට පත් සියළුම ජනතාව පිළිබඳව සොයා බැලූ බවත් කරගහවෙල වසමේ දෙහිගල වතුයාය වෙතද ගොස් අනාථ කඳවුරු වල ජනතාවගේ සුව දුක් සොයා බැලූ බවත් එම ජනතාවගේ පිවිසුම් මාර්ග විනාශවී ඇති බවත් ඒවා යථාතත්වයට පත්කිරීම ඉතා අපහසු වුවත් කෙසේ හෝ එම ජනතාව වෙනුවෙන් කඩිනමින් එම මාර්ග පිළිසකර කර දියයුතු බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා මෙවන් අනතුරක් මෙවන් කරදරයක් කිසිම පුද්ගලයකුට අත් නොවේවා කියා ප්‍රාර්ථනා කළේය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා අදහස් දැක්වීම.</u>

පිටකුඹුර කොට්ඨාසයේ තොටිල්ලකැටිය වසමේ නිවසකට ජල ගැලීම හේතුවෙන් දරුවෙකු හා මවක් අසරණ වී සිටි අවස්ථාවේ ජනතාවගේ සහයෝගය ඇතිව තමාද මැදිහත්වී ඒ අය බේරාගත් බවත් ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා බිබිල පොලීසියද මැදිහත්වීමක් සිදුකළ බවද පැවසීය. හාමාපොල හා තොටිල්ලකැටිය ප්‍රදේශයේ එක් නිවසක් පූර්ණව හා නිවෙස් කිහිපයකට අර්ධ හානි සිදුවී ඇති බවත් කොකුන්නෑව පන්සල ඉදිරිපිටින් දියකොලයාය ගම්මානයට ගමන් කරන මාර්ගය ගමන් කිරීමට නොහැකි ආකාරයටම අබලන් වී ඇති බවත් මේ වන විට නව පාසල් වාරය ආරම්භ වී ඇති බැවින් එම දරුවන්ට පාසල් යාමටද මාර්ගයක් නොමැති තත්වයට පත්ව ඇති බැවින් එම මාර්ගය තාවකාලිකව හෝ ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ගරු මූලාසනයෙන් ඉල්ලා සිටින ලදී. තම කොට්ඨාසයේ සේවය කරන රාජ්‍ය නිලධාරීන් පස්දෙනා එක්ව මේ විපතට පත්වූ ජනතාව පිළිබඳව සොයා බලා එම පවුල් සඳහා වියළි සලාක ලබා දීමට කටයුතු කර ඇති බවත් එම සියළු පවුල් පිළිබඳ සොයා බලා කටයුතු කර ඇති බවත් රජයක් වශයෙන් ජනාධිපතිතුමා හා ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම ඉතා විශිෂ්ඨ බවත් පැවසීය. බදුල්ල මහියංගන ප්‍රදේශවල විපතට පත් ජනතාවට සහායදීම සඳහා දින 6ක කාලයක් තමා එම ප්‍රදේශවලට ගොස් සුද්ධ පවිත්‍ර කිරීම් කටයුතු කළ බවත් මේ අවස්ථාවේදී ජනතාව සහයෝගයෙන් කටයුතු කිරීමෙන් පෙනී යන්නේ මෙවැනි ව්‍යසනයන්ට රටක් වශයෙන් මුහුණදීමට හැකියාවක් පවතින බවත් ශ්‍රී ලාංකීය විපතටපත් ජනතාව හා ජීවිතක්ෂයටපත් ජනතාව වෙනුවෙන් කණගාටුව හා ශෝකය ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වීම.</u>

දිට්වා සුළි කුණාටුවෙන් අවතැන් වූ ජනතාව සඳහා ශෝකය ප්‍රකාශ කළ අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමාට මගහැරුණු තැනක් මතක් කිරීමක් ලෙස, මීට පෙරද තමා දියකොලයාය මාර්ගය මොටර් ග්‍රේඩර් කරන ලෙස ඉල්ලීම් කළද එය එසේ නොකළ බවත් මෙම මාර්ගයේ කාණු පද්ධතිය සකස් කර තිබුනේ නම් මාර්ගය අබලන්වීම අවම කර ගැනීමට හැකියාවක් තිබුණා යැයිද එසේ කිරීමට නොහැකිවීම නිසා එම ප්‍රදේශයේ දරුවන් කබලෙන් ලිපට වැටුනාක් වැනි දෙයක් වුවා යැයි ද පැවසීය. තවද ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මන්ත්‍රීතුමාට මගහැරුණු තැනක් ලෙස අඹ ගොම්මන පාලම ලක්ෂ 10ක් වැනි මුදලකින් ප්‍රතිසංස්කරණය කිරීම් කරන ලෙස තමා මීට පෙර ඉල්ලුම් කලද එම අවස්ථාවේදී ලොකු මුදලක් වැයවන බව පවසමින් එය ප්‍රතිසංස්කරණය කිරීමට විරුද්ධව කටයුතු කළ බැවින් එම පාලම කැඩී යාම නිසා මේ වන විට එය ප්‍රතිසංස්කරණය කිරීමට රුපියල් ලක්ෂ 80ක් පමණ වැය වන බවත් මෙම හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාවට පාලමෙන් එහා මෙහා යාමට නොහැකිව අසරණ තත්වයට පත්ව ඇති බවත් පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා අදහස් දැක්වීම.</u>

ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ඉදිරිපත් කළ ආකාරයට දියකොලයාය මාර්ග පද්ධතිය කාණු යොදා සකස් කළේ නම් සිදුවූ හානිය අවම කර ගැනීමට හැකිවන

බවත් සභාවේ අරමුදල් ප්‍රශ්න හා මාස පහක පමණ කාලයක් JCB යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර තිබූ හෙයින් මාර්ග කැපීමට ගෙන තිබූ තීරණය පසුබෑමකට ලක්වූ බවත් සභාවේ අරමුදල් තත්වය හේතුවෙන් ලොකු මුදලක් වැයකර JCB යන්ත්‍ර කුලියට ගෙන මාර්ග කැපීමට නොහැකි විය. ශ්‍රී ලංකාවට ඇතිවී ඇති ව්‍යසන තත්වය හේතුවෙන් විනාශ වී ඇති මාර්ග , වාරි කර්මාන්ත , නිවාස ,දේපල යථා තත්වයට නගා සිටුවීම සඳහා රජයක් වශයෙන් මේ වනවිට ප්‍රතිසංවිධාන කටයුතු සැලසුම් කිරීම් සිදුකරමින් සිටින බවත් පැවසීය. විදෙස් රටවලින් හා දෙස් විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් මේ වනවිට ආධාර ලබා දෙමින් සිටින බවත් විදෙස් රටවලින් ද්‍රව්‍ය ,මුදල් , දායක කර ගතහැකි යන්ත්‍රසූත්‍ර ,කූඩාරම් ,ස්වෙච්ඡා හමුදාවන් තාවකාලික පාලම් බෝක්කු ඉදිකරමින් මූලික අවශ්‍යතාවයන් සපුරාලමින් ශ්‍රී ලංකාව නැවත යථාතත්වයට පත් කිරීමට සහාය දායකත්වය ලබාදී ඇති බවත් පැවසීය.

එසේම බිබිල ප්‍රදේශයේ ජනතාවද මෙම ජාතික ව්‍යවසනයෙන් බේරා ගැනීමට විවිධ සහයෝගයන් ලබාදුන් බවත් මේ සියළුම ජනතාවට බිබිල ප්‍රාදේශීය සභාවේ ස්තූතිය පුද කරන බවත් විපතටපත් ජනතාව වෙනුවෙන් ශෝකය හා කණගාටුව බිබිල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ප්‍රකාශ කරන ලදී.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

### 02.01. කාබනික පොහොර හැලීමේදී ඉවත් වන නොදිරන ලද කොටස් ඉවත් කිරීම සම්බන්ධවයි.

කාබනික පොහොර හැලීමේදී ඉවත් වන නොදිරන ලද කොටස් ඉවත් කර ගැනීමට අවශ්‍යව ඇත. මෙම නොදිරන ලද කොටස් දිරාපත් වීම සඳහා මාස තුනකට වැඩි කාලයක් ගතවන බැවින් කසල අංගන භූමියේ ප්‍රමාණවත් ඉඩක් නොමැති නිසාවෙන් මෙම කසල ඉවත් කළයුතුව ඇත. මෙම කසල බෝග සිටුවීමට පෙර වලවල් කපා එම වලවල් වලට දමා මාස තුනක පමණ කාලයක් වසා තබා එම වලවල් මත බෝග සිටුවීම කළහැකි බැවින් මෙම කසල ලබා ගැනීමට කැමති ගොවි මහතුන් සිටී නම් අයකිරීමකින් තොරව ලබාදීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටියි. එම කසල ලබා දීමේදී බිබිල ප්‍රාදේශීය සභාවෙන් අවසර පත්‍රයක් නිකුත් කර එම කසල රැගෙන යාමට අවසර ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට නිවේදනය කරන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.01. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල සතිපොළ 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් පටිපාටියකින් තොරව සභා තීරණයක් ගැනීම පිළිබඳවයි.

බිබිල සතිපොළ 2025 වර්ෂය සඳහා බිබිල මහා වෙළඳ සංගමය විසින් කරගෙන ගිය අතර ප්‍රාදේශීය සභාවේ දත්ත වලට අනුව පොළ බදු අයකර නියමිත දිනට හා නියමිත වේලාවට මාසික වාරිකය ගෙවා තිබියදී 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් පටිපාටියකින් තොරව ප්‍රාදේශීය සභාව මගින් බිබිල සතිපොළ කරගෙන යාමටත් පිටකුඹුර පොළ ටෙන්ඩර් කිරීමට ගෙන ඇති තීරණය අප විමතියට පත් කරන කරුණකි. අප විසින් 2025 වර්ෂය සඳහා ලබා ගත් ටෙන්ඩරයකට 5% ක මුදලක් එකතු කර සභාව විසින් පොළ බදු අය කිරීම පිළිබඳවත් 2026 සඳහා බදු වැඩිකර සභා සම්මත කරගත් බවත් දැනට අපට ලැබී ඇත.
තවද 2025 වර්ෂය සඳහා රු.1800000.00ට ලන්සු තීරණය කර තිබියදී වෙළඳ සංගමය 2828228.28 වැඩිපුර ටෙන්ඩර් ලංසු ඉදිරිපත් කිරීම නිසා බිබිල ප්‍රාදේශීය සභාව රු.1028228.00ක සෘජු ලාභයක් ලබාගෙන ඇත. එසේ තිබියදී 2026 වර්ෂය සඳහා 2025 වර්ෂයේ පොළ බදු අය කරන ලද වෙළඳ සංගමයට 2026 වර්ෂය සඳහාද ලංසු ඉදිරිපත් කිරීමට ඇති අයිතිය උල්ලංඝනය කර ඒකපාර්ශවික තීරණ ගැනීම අප තරයේ හෙලා දකිමු.
එම නිසා 2026 වර්ෂ සඳහා වෙළඳ සංගමයට නැවත පොළේ අයිතිය ලබා දෙන්නේ නම් 2026 වර්ෂය සඳහා රු.3400000.00ක මුදලකට අප සංගමයට ලබා ගැනීමට අප කැමැත්ත පල කරන අතර බිබිල ප්‍රාදේශීය සභාවට ලැබෙන ආදායම රු.600000.00ක් ඉක්වන වැඩිපුර ආදායමකි. එම සෘජුව ලැබෙන

ලාභය මත කිසියම් තීරණයක් ගෙන 2026 වර්ෂය සඳහා සභාවේ අවධානය යොමු කර අප වෙළඳ සංගමයට නැවත වතාවක් 2026 වර්ෂය සඳහා සතිපොළ ලබා දෙන ලෙස බිබිල බෞද්ධ වෙළඳ සංගමය ප්‍රමුඛ මහා වෙළඳ සංගමය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු මූලාසනය විසින් ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් දැක්වීම.</u>

පසුගිය විශේෂ සභාවාරයේ දී මෙම බිබිල සතිපොළ ටෙන්ඩර් නොදී බිබිල ප්‍රාදේශීය සභාවෙන්ම පොළ කාසි එකතු කිරීමට බහුතර කැමැත්තෙන් සහා සම්මත වූ බවත් මෙම වෙළඳ සංගමයෙන් ලක්ෂ 34ක් වැනි ලංසු මුදලකට ඉල්ලුම් කරන්නේ මෙමගින් ලාභයක් ලැබෙන නිසා වන්නට ඇතැයි ද එසේ තිබියදී ප්‍රාදේශීය සභාව බිබිල සතිපොළ පවත්වාගෙන යාමට ගත් තීරණය ප්‍රතික්ෂේප කරන්නේ කුමක් නිසාදැයි මන්ත්‍රී මණ්ඩලයට සිතෙනු ඇත. නමුත් ජනතාවට ව්‍යාපාරිකයින්ට වඩා හොඳ සුභ සාධනයක් ලබාදීමේ අභිමතාර්ථයෙන් මෙම සතිපොළ බිබිල ප්‍රාදේශීය සභාවෙන් පවත්වාගෙන යාම පරමාර්ථය වුවද මෙම බිබිල ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කිරීමේ ප්‍රධාන ආදායම් මාර්ගයක් බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා මේ වැනි විශාල මුදලකට ටෙන්ඩර් ගැනීමට පුද්ගලයින් ඉදිරිපත් වෙද්දී බිබිල ප්‍රාදේශීය සභාව අවධානමක් භාර ගන්නේ කුමකටදැයි ප්‍රශ්න කරන ලදී. බිබිල ප්‍රාදේශීය සභාවට සතිපොළෙහි විදුලි බිල්පත් පියවීමට විශාල මුදලක් වැයවන බවත් දෛනික වැටුපට සේවකයින් බඳවා ගැනීමට සිදුවන බවත් ඒ අය සඳහා ගෙවීම් කිරීමට විශාල මුදලක් වැයවන බවත් ආදායම් පරීක්ෂක මහතාටද විශාල වෙහෙසවීමකට මෙන්ම වගකීමක් ද පැවරෙන බවත් පැවසීය. මේ පිළිබඳ විශාල අත්දැකීමක් තමන් හට තිබෙන බැවින් බිබිල සතිපොළ ටෙන්ඩර් කර බඳු ලබාදීමට තමන් පවසන බවත් අනවශ්‍ය අවධානම් භාරගෙන තම සහෝදර මන්ත්‍රී මණ්ඩලය අධිභාරයකට මුහුණදීමට සිදුවුවහොත් යැයි සිතන බැවින් තමන් මෙසේ කතා කරන බවත් බිබිල සතිපොළ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමට විරුද්ධව ඡන්දය ලබාදී ඇති බැවින් තමාට ප්‍රශ්නයක් ඇති නොවන බවත් ඉන් නිදහස් වන බවත් පැවසීය.
බෞද්ධ වෙළඳ සංගමයට මෙම සතිපොළ බඳු දීමට අකමැති වන්නේ ජනතාවට තාඩන පීඩන එල්ල කරමින් අත්තනෝමතිකව හැසිරුණ නිසා බැවින් නම් එම සංගමය අසාදු ලේඛනයට ඇතුළත් කර එම සංගමයට බඳු නොදී විවෘත ටෙන්ඩරයකට ගොස් සුදුසු බඳුකරුවෙකුට ලබාදීමට කටයුතු කරන්නේ නම් සුදුසු බවයි.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.</u>

පසුගිය මහසභා වාරයේදී 2026 වර්ෂය සඳහා බිබිල සතිපොළ ටෙන්ඩර් නොකර බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමට තීරණය කරනු ලැබූ අතර මෙම වර්ෂයේදී බෞද්ධ වෙළඳ සංගමය මගින් බඳු ලබාගෙන සතිපොළ පවත්වාගෙන යන අතර මෙම සංගමය බෞද්ධ වෙළඳ සංගමයක් නම් ව්‍යාපාරිකයින්ට, ජනතාවට, කාන්තාවන්ට පීඩාකිරීම් සිදු නොවියයුතු බවත් ඒ පිළිබඳව සලකා බලා ගරු මූලාසනය විසින් මෙම සතිපොළ බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමට තීරණය කළ බව පැවසීය. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන සංකල්පය තුළ කටයුතු කරනු ලබන අතර විපක්ෂය මගින් 2026 අයවැය මගින් ආදායම් උත්පාදන මාර්ගයක් ඉදිරිපත් කර නැති බවට විරෝධතා ඉදිරිපත් කළද මෙම සතිපොළ පවත්වාගෙන යාම මගින් බිබිල ප්‍රාදේශීය සභාව ආදායම් උත්පාදනය කර ගැනීමට බලාපොරොත්තුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් පවසා සිටින ලදී. මෙම බෞද්ධ වෙළඳ සංගමය මගින් රු.2800000.00 ලංසුවකට 2025 වර්ෂයේ බඳු ලබා ගෙන ඇති අතර මෙය 2026 වර්ෂය සඳහා රු.3400000.00ක කට ඉල්ලුම් කරනු ලබන්නේ මහජනතාවට තාඩන පීඩන කර ලාභ උපයා ගැනීමට හෝ මීට පෙර විශාල ලාභයක් ලබා ඇති බැවින් යැයි තමා සිතන බවත් එබැවින් එක් අවුරුද්දක් හෝ මෙම සතිපොළ බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමට භාර ගතයුතු බව පැවසීය. පාසල් ගුරුවරයෙකු ලෙස දරුවන්ට උගන්වනු ලබන්නේ ඉලක්කයක් කරා ගමන් කිරීමට බවත් එසේ ගමන් කිරීමේදී අභියෝග, ගැටලු වලට මුහුණදීමට සිදුවන බවත් ඒවා මැඩගෙන ඉදිරියට යායුතු බවත්

ය. එසේ මෙම සතිපොළද ප්‍රාදේශීය සභාව මගින් භාරගෙන අභියෝගවලට මුහුණදී ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කරමු යැයි පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා අදහස් දැක්වීම.</u>**

මෙම බෞද්ධ වෙළඳ සංගමය මගින් රු.3400000.00කට බඳු ලබා ගැනීමට කැමති බව ප්‍රකාශ කර ඇති බවත් බිබිල ප්‍රාදේශීය සභාව මෙම සතිපොළ මගින් රු.2800000.00 ක ආදායමක් උත්පාදනය කිරීමට පවත්වාගෙන යන්නේ දැයි ප්‍රශ්න කර ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු මූලාසනය විසින් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා අදහස් දැක්වීම.</u>**

ගරු මන්ත්‍රී ඒ.එම් ධම්මික බණ්ඩාර මැතිතුමා පැවසූ ආකාරයට අභියෝග භාර ගතයුතු බවත් මෙම සතිපොළ පුද්ගලික අවශ්‍යතා සපුරා ගැනීමට භාර නොගන්නා බවත් මෙම සතිපොළේ ව්‍යාපාරිකයින්ට ජනතාවට සිදුවන තාඩන පීඩන වලින් මුදවා ගනිමින් වඩා හොඳ සුභ සාධනයක් ලබාදීමට මෙන්ම සභාව සඳහා ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස බවත්ය. පසුගිය වසර තුළ සතිපොළ ටෙන්ඩර් ලබාගත් බඳුකරුවන් ජනතාවට සැලකූ ආකාරය මෙම මහජන පැමිණිලි අධ්‍යන කිරීමෙන් හඳුනා ගතහැකි බව පැවසූ අතර මෙම ජනතා පැමිණිලි නිසා බඳුකරු පිළිබඳව ප්‍රාදේශීය සභාවේ ජාතික ජනබලවේග මන්ත්‍රීවරු නිතර සොයා බැලූ බවත් එසේ සොයා බැලීමේදී බඳුකරුගේ හැසිරීම යහපත් නොවන බව හඳුනා ගන්නා ලද බවත් ගරු මූලාසනය විසින් පැවසීය. එබැවින් ජනතාවට හා ව්‍යාපාරිකයින්ට අසාධාරණයක් නොවන ආකාරයට විනිවිධභාවයකින් විනීතව පවත්වාගෙන යාමේ අරමුණින් එක් අවුරුද්දක් හෝ බිබිල සතිපොළ බිබිල ප්‍රාදේශීය සභාව මගින් පොළ කාසි එකතු කරමින් පවත්වාගෙන යාමට තීරණය කළ බවත් ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලය හා සභාවේ පරිපාලනයද මැදිහත්වී සහයෝගය ලබාදීමට ද කැමැත්ත පලකළ බවද තවදුරටත් ප්‍රකාශ කර සිටියේය. ආදායම අඩුවීම පිළිබඳ ප්‍රශ්නයක් ඇතිකර නොගන්නා ලෙසත් එසේ අධිභාරවීමක් සිදු නොවන බවත් ප්‍රාදේශීය සභාවේ කාර්යභාරය බදු එකතු කිරීම පමණක් නොව ජනතාවගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම බවත් බෞද්ධ සුභසාධන සංගමය සතිපොළ පවත්වාගෙන යාමේදී සිදු වූ කාන්තා හිංසන , ජනතාව පීඩනයට පත් කිරීම්, ව්‍යාපාරිකයින් පීඩනයට පත් කිරීම් වැනි ක්‍රියාවන් බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමේදී වලක්වා ගෙන කටයුතු කිරීමට හැකිනම් එම තත්වය ඇති කිරීමට කටයුතු කිරීමේ පරමාර්ථයෙන් බිබිල සතිපොළ බිබිල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමට තීරණය කළ බවයි. එබැවින් සමාජ සුභ සාධනය ප්‍රමුඛ කොට ගෙන බිබිල සතිපොළ සම්බන්ධයෙන් පසුගිය සභාවාරයේ ලබාගත් තීරණය වෙනස් නොකර බිබිල ප්‍රාදේශීය සභාව මගින්පොළ කාසි එකතු කරමින් පවත්වාගෙන යාමට තීරණය කරන බවත් ලංසු මුදල් වැඩි කරමින් බෞද්ධ වෙළඳ සංගමය සතිපොළ බඳු ගැනීමට ඉල්ලුම් කරනු ලබන්නේ එමගින් ලැබූ ලාභය නිසා හා ජනතාවට දැඩි පීඩනයක් එල්ල කර අසාධාරණව බඳු එකතු කර ගැනීමට හැකියාව ඇතැයි සිතා බවත්ය.
ඕනෑම අයෙකුට රුපියල් ලක්ෂ 100කට බඳු ලබා ගැනීමට කැමති බව ප්‍රකාශ කර ලිපි රාශියක් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකි වුවත් ඒ අය ටෙන්ඩර් කිරීමේදී බඳු ලබා නොගෙන සිටීමට හැකියාවක් ඇති බවත් එවැනි පහත් තත්වයකට ගරු සභාව පත් නොවිය යුතු බවද පැවසීය.

## <u>04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.</u>

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## <u>05.යථාපරිදි කල්දී ඇති යෝජනා.</u>

## 05.01.<u>ගරු මූලාසනයේ යෝජනා.</u>

**05.01.01. විශේෂ අවසරපත්‍ර ගාස්තු (ජංගම වෙළදාම) සම්බන්ධවයි.**

2023 ජුනි 28 වැනි දින අංක 1816/43 දරන පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාතේ විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ 23 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බිබිල ප්‍රාදේශීය සභා සීමාව තුළ ජංගම වෙළදාමක් පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු අයකිරිමට ප්‍රාදේශීය සභාවට බලතල ඇත.

ඒ අනුව, 2024 පෙබරවාරි මාසය වන තෙක් ජංගම වෙළදාම සඳහා ගාස්තු අය කල නමුත් එතැන් සිට මේ දක්වා එම ගාස්තු අයකර නොමැත. ජංගම වෙළෙඳ රථ ස්ථානගත කිරීමේ ගැටලුවක් පවතින බැවින් එම ආදායම් ලබා ගැනීම තාවකාලිකව අත්හිටුවා තිබීම මීට හේතුවයි.

නමුත්, බලප්‍රදේශයේ සෑම තැනම ජංගම රථ මගින් විවිධ ව්‍යාපාර සිදු කරන අතර (පාන් ලොරි, මාළු, වළං, පැලවර්ග, එළවළු) එම ව්‍යාපාරිකයින් මගින් ජංගම වෙළදාම සඳහා ගාස්තුවක් මේ වන විට අයවී නොමැත.

එබැවින්, 2026 වර්ෂය සඳහා ඉහත ගාස්තු අය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බැවින් ඒ පිළිබඳව සාකච්ඡා කර ක්‍රමවේදයක් තීරණය කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

නගරයේ ජංගම වෙළදාමේ යෙදෙන පාන් ලොරි වලින් මේ වනවිට රු.5000.00 ක මුදලක් අය කරන බවත් විසිතුරු මසුන් , මාළු වෙළදාම , රස කැවිලි නිෂ්පාදන, වළං, පැල වර්ග, පළතුරු ආදිය ලොරි රථ මගින් විකුණනු ලබන අතර ඒවායින් දෛනිකව ගාස්තුවක් අය කරන බවත් පැවසූ **ගරු මූලාසනය** මේවායින් මුදල් අය කිරීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගතයුතු බව පැහැදිලි කරන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා**

මෙම පාන් ලොරි වලින් මාසිකව රු.5000.00ක මුදලක් අය කරන විට සාමාන්‍ය දිනකට රු.167.00 ක පමණ මුදලක් අය කරන බවත් එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් මාසිකව රු.7000.00 ක් වත් අය කළ යුතු බවත් අනෙකුත් දෛනිකව පැමිණෙන ජංගම රථ මගින් දිනකට රු.1000.00 ක මුදලක් වත් අය කිරීමට සුදුසු බව අදහසක් ලෙස ඉදිරිපත් කරන බව පවසා සිටින ලදී.

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මගින් තීරණ ගෙන ඇත්තේ මෙම පාන් ලොරි මෙම ස්ථානයෙන් ඉවත් කරන ලෙස බවත් එබැවින් ඒවා ජනවාරි මාසයේ සිට වෙනත් ස්ථානයක ස්ථාපිත කළයුතු බවත් එම ව්‍යාපාරිකයින්ට නව ස්ථාන සකස් කර ගැනීමට හා එම ස්ථානයට ජනතාව පුරුදු කර ගැනීමට කාලයක් ගත වන බැවින් එම පාන් ලොරි වලින් මූලික පියවර වශයෙන් රු.5000.00 ක් අය කිරීමට සුදුසු බවත් ඉදිරියේදී මෙම පාන් ලොරි වලින් මාසිකව අය කරනු ලබන මුදල වැඩි කිරීමට කටයුතු කරමු යැයි ද මුදල පමණක් නොව ව්‍යාපාරිකයින්ගේ ජීවනෝපාය පිළිබඳවත් සලකා බලමු යැයිද **ගරු මූලාසනය** විසින් පවසා සිටින ලදී.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් මෙම පාන් ලොරි බස් නැවතුම්පොලින් ඉවත් කිරීමට තීරණය ගෙන තිබුණද මේ වන විටත් ඉවත් කිරීමට නොහැකිව තිබෙන බැවින් , මෙහි පළමු අභියෝගය වන්නේ බස්නැවතුම් පොලෙන් පාන් ලොරි ඉවත් කිරීම නිසා මෙම ලොරි වලින් අය කරනු ලබන මුදල වැඩි කිරීම නොව ඉවත් කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවයි.

**ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා**

"2023 ජුනි 28 වැනි දින අංක 1816/43 දරන පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාතේ විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ 23 වන අතුරු

ව්‍යවස්ථාව යටතේ බිබිල ප්‍රාදේශීය සභා සීමාව තුළ ජංගම වෙළදාමක් පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු අයකිරිමට ප්‍රාදේශීය සභාවට බලතල ඇත.'' ලෙස දක්වා ඇති බැවින් මෙම ජංගම වෙළදාම මගින් ගාස්තු අය කරනු ලබන්නේ නගර සීමාව තුළද එසේත් නැතිනම් මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේමද දැයි ගරු මූලාසනයෙන් ප්‍රශ්න කරන ලදී.

මෙම තීරණය ගනු ලබන්නේ බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටම බවත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී පරිපාලනමය දුෂ්කරතා පවතින බැවින් නගර සීමාවේ මේ වනවිට ක්‍රියාත්මක කරන බවත් ඉදිරියේදී බල ප්‍රදේශයේම ක්‍රියාත්මක කරමින් ආදායම් උත්පාදනය කිරීමට බලාපොරොත්තු වන බවත් **ගරු මූලාසනය** විසින් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකොන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්චඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව අධ්‍යනය කර තීරණයක් ලබා ගැනීමට ඊළඟ මහ සභාවට කල් තබන ලදී.

අදාළ යෝජනාව **කල් තැබීම** සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් කල් තැබීමට මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඊළඟ මහ සභාවට කල් තබන ලදී.

## <u>05.01.02.අනවසර ප්‍රචාරක දැන්වීම් පුවරු ඉවත් කිරිම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාවෙන් අවසර ලබා නොගෙන ව්‍යාපාරික පරිශ්‍රයන්හි සහ පාසැල් පරිශ්‍රයන්හි සවිකර ඇති (උපකාරක පංති සම්බන්ධ පුවරු) ප්‍රචාරක දැන්වීම් පුවරු ඉවත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවලක් සකස් කර ගැනීමට අවශ්‍ය බැවින් ඒ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>
මීට පෙර පැවති සභාවල මෙම ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සභාවේ අවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමටත් අනෙකුත් දැන්වීම් පුවරු වලින් ගාස්තු අයකිරීමටත් සභා තීරණ ලබාගෙන ඇති බවත් එම තීරණ මාස දෙක තුනක් තුළ ක්‍රියාත්මක කර නැවත අක්‍රීය තත්වයට පත්වන බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා</u>
යම් ආයතනයකින් ජේන්ට් කර රෝලර් ඩෝර් එකක ආයතනයේ නම ප්‍රදර්ශනය කර තිබේ නම් ඒ සඳහාද ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකළ හැකිදැයි ප්‍රශ්න කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දේශපාලන දැන්වීම් පුවරු වෙළඳ ව්‍යාපාරික දැන්වීම් පුවරු ,අධ්‍යාපනික දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරනු ලබන බවත් මෙම දැන්වීම් පුවරු වලින් මුදල් අයකළයුතු බවත් විශේෂයෙන් පෞද්ගලික අධ්‍යාපන ආයතන වල දැන්වීම් පුවරු සඳහාද මුදල් අයකළ යුතු බැවින් එම පෞද්ගලික අධ්‍යාපන ආයතන ප්‍රධානීන් රැස්කර අය කළයුතු මුදල ,දැන්වීම් ප්‍රදර්ශනය කළයුතු කාලසීමාව ප්‍රදර්ශනය කළයුතු ස්ථාන ආදිය පිළිබඳව සාකච්ඡා කිරීමට සුදුසු බවත් එසේ සාකච්ඡා කිරීමෙන් පසුව නැවත මෙම යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කල් තබන ලදී.

අදාළ යෝජනාව **කල් තැබීම** සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව කල් තැබීමට මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඊළඟ මහ සභාවට කල් තබන ලදී.

## 05.01.03. GE – 5963 අත්ට්‍රැක්ටර් ටේලර් රථය හා RX – 9034 ටේලර් රථය සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් RX 9034 ටේලර් රථය හා GE -5963 අත්ට්‍රැක්ටර් ටේලර් රථය අළුත්වැඩියා කිරිම සඳහා නිර්දේශ ලබා ගැනීමට පළාත් යාන්ත්‍රික දෙපාර්මේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.
ඒ අනුව ටේලර් රථ පරීක්ෂා කල අතර වැය වන මුදල සලකා බැලීමේ දී මෙම ටේලර් අළුත්වැඩියා කිරීම ඵලදායි නොවන බව දන්වා ඇත. එබැවින් අබලන් තත්වයේ පවතින මෙම ටේලර් රථ සඳහා කල යුතු ඉදිරි කටයුතු පිළිබඳ තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී පි.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය මගින් අපහරණය කිරීමට ඉදිරිපත් කර තිබූ රථයක් අලුත්වැඩියා කර මැදගම ප්‍රාදේශීය සභාවේ අවමංගල රථය ලෙස භාවිතා කරන බවත් එබැවින් මෙම RX 9034 ටේලර් රථය හා GE -5963 අත්ට්‍රැක්ටර් ටේලර් රථය අපහරණය නොකර අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හැකිදැයි පරීක්ෂා කර බලා තීරණයක් ගැනීමට සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා</u>
රිදීමාලියද්ද ප්‍රාදේශිය සභාවේ මීට පෙර පාලනය කළ සභාපතිතුමා විවිධ රාජ්‍ය ආයතන වල අපහරණය සඳහා නම් කර තිබූ වාහන ගෙනවිත් අලුත්වැඩියා කර භාවිතයට ගෙන ඇති බවත් එබැවින් මෙම මහ සභාවේදී තීරණයක් නොගෙන ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ඉදිරි සභාවාරයට කල් තැබීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා ,ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා , ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා යන මන්ත්‍රී මණ්ඩලය විසින් මෙම ටේලර් රථ දෙක පිළිබඳව අද දිනම පරීක්ෂා කර බලා භාවිතයට ගත හැකි නොහැකි බව තීරණය කරන ලෙසත් මෙම යෝජනාවද ඉදිරි මහ සභාවට කල් තබන බවත් ගරු මූලාසනය විසින් පැවසීය.

අදාළ යෝජනාව **කල් තැබීම** සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් කල් තැබීමට මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඊළඟ මහ සභාවට කල් තබන ලදී.

**05.01.04.වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම**

2026 වර්ෂයේ අයවැය වාර්තාව අනුව සකස් කරන ලද 2026 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහ සම්මත විය.

**05.01.05. 2026 වර්ෂය සඳහා ලංසු විවෘත කිරීමේ කමිටුව පත් කිරීම.**

2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශිය සභාවට ලබා ගන්නා භාණ්ඩ, වැඩ හා සේවා සඳහා මිල ගණන් කැඳවීමේ දී ලංසු විවෘත කිරීමේ කමිටුව වශයෙන් පහත නිලධාරීන් පත් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | ඩී.එම් අනුෂා එස්. දිසානායක මිය | සභා ලේකම් | සභාපති |
| 02 | කේ.ඕ.එච්.බී. තිලකරත්න මයා | ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි | සාමාජික |
| 03 | ටී.ආර්.එම්.සුලෝචනා සෙනෙවිරත්න මිය | කාර්මික නිලධාරි | සාමාජික |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06. ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම.**

2025 වර්ෂයේ ප්‍රසම්පාදන කමිටුව වශයෙන් කටයුතු කළ පහත නම් හා තනතුර සඳහන් සාමාජිකයන් 2026 වර්ෂයේ ප්‍රසම්පාදන කමිටුව ලෙස පත්කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | තනතුර | කමිටු තනතුර |
|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මයා | ගරු සභාපති | සභාපති |
| 02 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 03 | ඩබ්.එම්.රූපසේන මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 04 | ආර්.බී.ප්‍රේමතිලක මයා | ගරු මන්ත්‍රී | සාමාජික |
| 05 | ඩී.එම් නිශාන්ත අමරතුංග මයා | ගරු මන්ත්‍රී | සාමාජික |

**ප්‍රසම්පාදන කමිටුවේ කාර්යභාරය**

- මුදල් හා ප්‍රතිපාදන ඇති බව තහවුරු කර ගැනීම
- ප්‍රසම්පාදන ක්‍රමය, ලංසු ආරාධනා කරන දිනය, ලංසු විවෘත කිරිමේ දිනය තීරණය කිරීම
- ලංසු ලේඛන සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු හා එකඟ වීම
- තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් පැහැදිලි කිරීම් ලබා ගැනීම
- තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හා වාර්තා ඇගයීම
- ලංසුකරුවන් සමඟ සාකච්ඡා කිරීම
- ලංසු ප්‍රදානය සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීම

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07. 2026 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.**

2026 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08. 2026 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.**

2026 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09. 2026 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව පත් කිරීම.**

2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශිය සභාවේ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව පත් කර ගැනිමට අවශ්‍ය බැවින් ඒ සඳහා පහත නම් සඳහන් නිලධාරින්පත් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කමිටු තනතුර | නම | සේවා තනතුර |
|---|---|---|---|
| 01 | සභාපති | ඩී.එම්.අනුෂා එස් දිසානායක මිය | සභා ලේකම් |
| 02 | සාමාජික | කේ.ඕ.එච්.බී.තිලකරත්න මයා | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි |
| 03 | සාමාජික | ටී.එම්.දයානි පුෂ්පලතා මැණිකේ මිය | සංවර්ධන නිලධාරි |
| 04 | සාමාජික | ඩී.එම් හසිත මධුෂාන් මයා | කළමනාකරණ සේවා නිලධාරි |
| 05 | සාමාජික | කේ.ඉන්ද්‍රා ශ්‍යාමලි මිය | සංවර්ධන නිලධාරි |
| 06 | සාමාජික | ටී.එච්.එස්.සෝමරත්න මයා | සංවර්ධන නිලධාරි |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්තී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.10. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරනු ලබන දෙවන ජාත්‍යන්තර සමුළුවට සහභාගිවීම සඳහා සහභාගිත්ව ගාස්තු ගෙවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා</u>**

පළාත් පාලන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරනු ලබන දෙවන ජාත්‍යන්තර සමුළුව 2025 දෙසැම්බර් මස 01 වන දින සහ 02 වන දින කැලණිය, වෙදමුල්ල, විශ්‍රාමිකයන්ගේ නිවාඩු නිකේතනයේ දී පැවැත්වෙන බව දන්වා ඇත.
එම වැඩසටහන සඳහා පහත නම් සඳහන් මහජන නියෝජිතයන් සහභාගිවන බවට තොරතුරු දන්වා යවා ඇති අතර එක් සාමාජිකයකුට සහභාගිත්ව ගාස්තු රු.3000.00 බැගින් සමාජිකයන් 02 සඳහා රු.6000.00 මුදලක් වැය වන අතර එම ගාස්තුව ගෙවීම සඳහා අනුමැතිය ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | සම්පූර්ණ නම | තනතුර |
|---|---|---|
| 01. | විදානගමගේ සරත් විදානගම | ගරු සභාපති |
| 02. | වාසළ වන්නි මුදියන්සේලාගේ මනොජ් අසංක වාසළ | ගරු මන්ත්‍රී |

මෙම වැඩ සටහන දින නියමයක් නොමැතිව කල්තබා ඇති බැවින් යෝජනාව අවලංගු කරන ලදී.

**<u>05.01.11.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම</u>**

2025.11.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් විථි ලාම්පු ගබඩාව සඳහා LED බල්බ 800 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

2. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් RB 4989 ට්‍රැක්ටර් රථය සඳහා 90A වර්ගයේ බැටරියක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

3. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ලිපිද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ ගබඩාව සඳහා පහත ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ටෝනර් (ඉහළ මහල ෆොටෝ කොපි මැෂින් එක සඳහා) | 01 |
| 02 | හාපික් (450 ml ) | 20 |
| 03 | මාස්ක් | පෙට්ටි 05 |
| 04 | සබන් | 600 |
| 05 | ටයිල් ක්ලීනර් (1 L ) | 20 |

4. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් රදලියද්ද ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීම සඳහා විදුලි බලය ප.ව.5.00 න් පසු අඩු වන බැවින් ජෙනරේටරයක අවශ්‍යතාවය පවතින බැවින් 18 KVA ධාරිතාවයෙන් යුතු ජෙනරේටරයක් මාසික කුලී පදනම මත ප්‍රසම්පාදනය කර ලබා ගැනීම .

5. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් රදලියද්ද ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමෙන් පසු හෂ්මාවශේෂ වැඩි පිරිසක් රැගෙන නොයාම නිසා 2026 ගැසට් පත්‍රයේ එම කරුණ පහත පරිදි සශෝධනය කිරීම.

| අ.අ. | ගැසට් පත්‍රයේ සඳහන් වී ඇති ආකාරය | ගැසට් පත්‍රයේ සශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01. | සුසාන භූමියේ අඩි 1 ½ X 1 ½ වළක තැන්පත් කිරීම සඳහා - රු.3000.00 | හෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා - රු.3000.00 |

6. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු ගබඩාවේ සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් සඳහා නිකුත් කරන පහත ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | වල් කපන මැෂින් තල | 05 |
| 02 | වල් කපන මැෂින් ප්ලග් | 10 |

.

7. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු ගබඩාවේ ආයතන නිලධාරීන් සඳහා නිකුත් කරන පහත සඳහන් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | පංචර් | 05 |
| 02 | මවුස් | 05 |
| 03 | මවුස් පෑඩ් | 05 |

8. බිබිල ප්‍රාදේශීය සභා පුස්තකාලයට 2025 වර්ෂය සඳහා පරිත්‍යාග ලෙස ලැබුණු ප්‍රාදේශීය සභා (4 තැන්පත්) ශිර්ෂය යටතේ තැන්පත් කර ඇති රු.40,000.00 මුදල බිබිල මහජන පුස්තකාලය සඳහා උසස් පෙළ හා සාමාන්‍ය පෙළ විෂයන්ට අදාළ විෂය නිර්දේශිත පොත් කට්ටලයක් එම විෂයන් සම්බන්ධව කටයුතු කරන කමිටුවකගේ නිර්දේශ ලබා ගෙන මිලදී ගැනීම.

9. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA 5419 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ රේසර් අළුත්වැඩියා කිරීම සඳහා යන්ත්‍රය ගලවා පරීක්ෂා කළ බිබිල, මොණරාගල හන්දිය, උසාවිය ඉදිරිපිට, බංඩාර ඉන්ජිනියරින්ග් ආයතනයෙන් එම අළුත්වැඩියා කටයුතු සිදු කර ගැනීම.

10. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA 5164 බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා 19.5X24 ටයර් එකක් 100 A බැටරියක් මිලදී ගැනීම.

11. 2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථ තුන පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවෙන්ද අනෙක් සියලු වාහන හා යන්ත්‍ර සූත්‍ර 18 ප්‍රසම්පාදනය කර වාර සේවා කිරීම. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා වන රක්ෂණ කාලය 2026.02.13 දිනෙන් අවසන් වන බැවින් 2026.02.14 සිට වාහන හා යන්ත්‍ර සූත්‍ර 21 ක් සඳහා ප්‍රසම්පාදනය කර රක්ෂණ කටයුතු සිදු කිරීම

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකගතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකගතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.12. මෘත දේහ ආදාහනය කිරිම සඳහා වේලාවන් ලබා දීම සම්බන්ධවයි</u>**

බිබිල රදලියද්ද අදාහනාගාරයේ මෘත දේහයක් ආදාහනය කිරිමට පැය 03ක කාලයක් ගත වන අතර බොහෝ දිනවල ආදාහනය සඳහා දිනකට මෘත දේහ 2ක් හෝ 3ක් රැගෙන එන අතර ඒ සඳහා වේලාවක් ලබා දීමේදි ගැටළු රාශියකට මුහුණ දීමට සිදුව ඇත. එබැවින් මෘත දේහ ආදාහනය කිරිම සඳහා නිශ්චිත වේලාවන් තීරණය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

දිනකට ආදාහනය කරනු ලබන වේලාවන් ප.ව.2.00, ප.ව.4.00, ප.ව.6.00 ට සිදු කිරීමටත් මෙහිදී ආදාහනය වෙන් කරනු ලබන විට වෙන් කරනු ලබන පිළිවෙලට තමන් කැමති වේලාව ලබා දීමට ප්‍රමුඛතාවය ලබාදීමටත් ලබා දෙනු ලබන වේලාවටම මෘත දේහය රැගෙන එන ලෙස අවධාරණය කළයුතු බව **ගරු මූලාසනය** විසින් පැවසීය. මෙම දිනවල සිසිල් දේශගුණික තත්වය හේතුවෙන් සිලින්ඩර වල ඇති ගෑස් ද්‍රවමය තත්වයට පත්වන බැවින් ඉංජිනේරුවරුන්ගේ උපදේශය වූයේ භාවිතා කරනු ලබන ගෑස් සිලින්ඩර් ප්‍රමාණය 10ක් ලෙස වැඩි කර ගන්නා ලෙසත් ආදාහනය සඳහා ගෑස් සිලින්ඩර් වලින් ගෑස් නිකුත් කිරීමේදී ගෑස් සිලිනඩර් විනාඩි 10න් 10ට මාරු කිරීමටත් එවිට ගෑස් ද්‍රවමය වීම අවම වන බව හා කාමරයේ උණුසුම වැඩිකිරීමත්ය.

මේවන විට සිලින්ඩර 06ක් තිබෙන බවත් එම ප්‍රමාණය 10ක් දක්වා වැඩි කර ගැනීමට ලිට්‍රෝ සිලින්ඩර් 04ක් මිලදී ගැනීමටත් සිසිල් දේශගුණික තත්වය වෙනස් වන තෙක් උණු ජල බඳුනක ගෑස් සිලින්ඩර් බහාලීමට කටයුතු කිරීමටත් උත්සාහ කළයුතු බව **ගරු මූලාසනය** විසින් පැවසීය.

කෙසේ වුවද මේ වනවිට ආදාහනාගාරය ආරම්භ කර ඇති බැවින් එය වසා තැබීමට නොහැකි බවත් එය වසා තැබුවහොත් දැනට ගොඩනගාගෙන ඇති කීර්ති නාමයට හානියක් සිදුවන බවත් දිනකට එක් ආදාහනයක් හෝ සිදු කළයුතු බවත් පැවසූ අතර ආදාහනාගාරයේ චිමිනියේ දුම පහතට ගමන් කිරීම පිළිබඳව ගම්වාසීන්ගෙන් පැමිණිලි රාශියක් ලැබෙන බවත් බාහිර ප්‍රදේශය ආරක්ෂා කර ගැනීම සඳහා එම චිමිනිය උස් කර සෑදිය යුතු බැවින් එම චිමිනිය උස්කර දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඉල්ලුම් කිරීමට කටයුතු කළයුතු බවත් **ගරු මූලාසනය** විසින් පැවසීය.

මරණ සහතිකයෙහි භූමදානය කරන ස්ථානය නම් කිරීමේදී ජනතාව ප්‍රාදේශීය සභාවෙන් අසනවාදැයි ගරු මන්ත්‍රී **ආර්.බී. අත්තනායක මැතිතුමා** විසින් ගරු මූලාසනයෙන් විමසන ලදී.

සභාවෙන් පළමුව අවසර ලබා ගන්නා බවත් හදිසියේ එසේ දැනුවත් නොකර කිසියම් අයෙකු මරණ සහතිකයෙහි භූමදානය කරන ස්ථානය රදලියද්ද සමුදුන් මැදුර ආදාහනාගාරය ලෙස නම් කරගෙන තිබේනම් එවැනි අවස්ථාවක ඒ අයට සහයෝගය දැක්වීමට කටයුතු කරමු යැයිද **ගරු මූලාසනය** පැවසීය.

ගෑස්සිලින්ඩර සඳහා තාවකාලික ක්‍රමයක් ලෙස කාමරය උණුසුම් කර ගැනීම සඳහා 100w බල්බ් තුනක් පමණ දල්වා තැබිය හැකි බව ගරු මූලාසනය විසින් පවසන අවස්ථාවේ **ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා** විසින් 1000wක ෆ්ලැසර් බල්බයක් දල්වා තබන්නේ නම් උණුසුම වැඩිවන බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා** විසින් 100W බල්බ 04ක් සවිකර උණුසුම් කිරීම් කටයුතු කිරීමට සුදුසු බව පැවසීය. සුළු මුදල් වලින් අද දිනට 100Wබල්බ 04ක් මිලදී ගෙන සවි කරන ලෙස ගරු මූලාසනය විසින් සභා ලේකම් තුමිය වෙත දැනුවත් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා**</u>

ආදාහනාගාරය වෙන් කර ගැනීම සඳහා පැමිණි දොඩම්ගොල්ලේ පුද්ගලයෙකු භෂ්මාවශේෂ තැම්පත් කිරීමට ස්ථානයක් නොමැති නිසා මැදගම ආදාහනාගාරය වෙත මෘතදේහය රැගෙන ගිය බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා පසුගිය සභාවාරයේදී ආදාහනාගරයේ පැති බැම්ම ඉදිකිරීමේදී භෂ්මාවශේෂ තැම්පත් කොට මල් පෝච්චි තැබීමට ප්ලේට් එකක්ද යෙදීමට තීරණය ලබා ගත්තද මේ වන විට එම බැම්ම සඳහා ප්ලේට් එකක් ඇතුළත් කර නොමැති බව ප්‍රකාශ කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

රදලියද්ද සමුදුන් මැදුර ආදාහනාගාරයේ ආදාහන කටයුතු ප.ව. 2.00, ප.ව. 4.00, ප.ව. 6.00 ට සිදු කිරීමටත් ආදාහනාගාරය සඳහා ලිට්‍රෝ ගෑස් 37.5kg සිලින්ඩර් 4ක් මිලදී ගැනීමටත් ගෑස් තැන්පත් කාමරය උණුසුම් කිරීම සඳහා 100W සූත්‍රිකා බල්බ 04ක් මිලදී ගෙන සවි කිරීමටත් ආදාහනාගාරයේ දුම පිටවීම සඳහා සකස් කර ඇති චිමිනිය අවශ්‍ය ප්‍රමාණයට උස් කර සකස් කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත දැනුවත් කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**05.01.13. බිබිල සතොස බදු ගිවිසුම සඳහා අනුමැතිය ලබා ගැනීම.**</u>

බිබිල ප්‍රාදේශීය සභාව සතු සතොස ගොඩනැගිල්ල සඳහා අත්සන් කරන ලද බදු ගිවිසුම් කාලය 2025.12.31 දිනෙන් අවසන් වේ. 2026.01.01 දින සිට 2027.12.31 දින දක්වා බදු ලබා දීම සඳහා සකස් කරන ලද බදු ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.14. එච්.එම්.ඒ.මුනාෆ් මහතා විසින් පවත්වාගෙන යනු ලබන කණුල්වෙළ එළ ගවමස් වෙළදසැල සම්බන්ධවයි.</u>**

බිබිල ප්‍රදේශීය සභාවේ 2025.09.25 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.11 තීරණය අනුව දැනට කණුල්වෙල එළගවමස් වෙළඳසැල පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාරික මහතා හට එහි අයිතිය තහවුරු කරන ලෙස දන්වා යවන ලෙසත් කණුල්වෙල ප්‍රදේශයේ කඩකාමරයක් කුලියට ගෙන ටෙන්ඩර් කර ගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සුදුසු බවටත් යෝජනා කර ඇත.

දැනට කණුල්වෙල පවත්වාගෙන යනු ලබන එළගවමස් වෙළඳසැල මෙම සභාවට අයත් ගොඩනැගිල්ලක් නොවන බැවින් එම ගොඩනැගිල්ලේ දැනට වෙළදාම් සිදුකරන එච්.එම්.ඒ.මුනාෆ් යන අය වසර ගණනක්ම එහි වෙළඳ කටයුතු සිදුකරන බැවින් ඊට ප්‍රදේශ වාසීන්ගේ විරෝධතා මතුවීම හේතුවෙන් 2026 වර්ෂයට එම දේපල බදු දීමට නම් එහි අයිතිය තහවුරු කරන ලෙස ඒ මහතා හට දන්වන ලදි.

එහෙත් ඔහු විසින් 2025.01.01 දින සිට ඉදිරි වසර 05 ක් සඳහා වෙළදාම් කිරීමට ඇතිකරගත් ගිවිසුමක් 2025.10.30 දින අප වෙත ඉදිරිපත් කර ඇත.මෙම බදු ගිවිසුම කඩ කාමරයේ අයිතිය තහවුරු කිරීමක් ලෙස පිළිගත හැකි සාක්ෂියක් නොවේ.

තවද කණුල්වෙල ප්‍රදේශයේ ඇති කඩ කාමරයක් ප්‍රාදේශීය සභාව වෙත බදු දීමට කැමැත්ත පල කරමින් ලිපියක් මඟින් 2025.10.31 දින එම්. ආර්. තාජුදින් යන අය මා වෙත දැනුවත් කර ඇත.

මෙම කරුණු හේතුවෙන් කණුල්වෙළ එළගවමස් කඩයක් විවෘත කිරීම ගැටළු සහගත බැවින් ඉදිරි කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මේ පිළිබඳව 2025.12.05 විශේෂ මහ සභාවේ දී දීර්ඝව සාකච්ඡා කර තීරණයක් ලබාගත් බවත් ඒ අනුව කටයුතු කරමු යැයි ගරු මූලාසනය විසින් පවසා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.බී අත්තනායක මැතිතුමා</u>
එළගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට ලබාදීමට ප්‍රකාශ කළ එම්.ආර්. තාජුදීන් මහතා විසින් මෙම කඩකාමරය නොමිලේ ලබාදීමට කැමති බව ප්‍රකාශ කළ අතර ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාව හා එම මහතා සමඟ ගිවිසුම්ගත වීමේදී එම මහතා හට කණුල්වෙල එළ ගවමස් ව්‍යාපාරයෙහි ටෙන්ඩරය නොලැබුණද බිබිල ප්‍රාදේශීය සභාවට එම කඩ කාමරය නොමිලේ ලබා දීමට ගිවිසුම් ගත විය යුතු බවයි.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය 2026 ජනවාරි 01 දින සිට 2026 මාර්තු 31 දින දක්වා මෙම වෙළඳසැල පවත්වාගෙන පැමිණි එම්.එම්.අබ්දුල් මුනාෆ් මහතා හටම පවත්වා ගෙන යාමට අවස්ථාව ලබාදීටත් 2025 වර්ෂයේ අයකළ වාර්ෂික කුලිය වන රු.630,000.00 ක මුදලට 10%ක් වැඩිකර කුලී අයකළයුතු බවත් එවිට මෙම ව්‍යාපාරික මහතාගෙන් මාසික කුලිය ලෙස රු.57,750.00ක් හා ඇපතැම්පතු මුදල 173,250.00ක් අය කිරීමටත් 2026.04.01 දින සිට 2026.12.31 දින දක්වා කාලයට කණුල්වෙල එළගව මස් ව්‍යාපාරය සඳහා කඩ කාමරයක් සොයාගෙන එම කඩ කාමරය ටෙන්ඩර් කර බදු ලබාදීමටත් සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.15. බිබිල සතිපොල E කඩ කාමර සම්බන්ධවයි.</u>**

බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ 2025.08.19 දිනැති අංක 05.01.06 සභා තීරණයට අනුව බිබිල නව සති පොළ E කඩ කාමර 13 සඳහා කීමනි මුදලක් ලබාගෙන එම කඩ කාමර වල වැඩ අවසන් කිරිම සුදුසු බවද බදු ලබාදෙන කාලය වසර 03ක් ලෙසත්,වැඩ අවසන් කර එම කඩ කාමර තක්සේරු කරන තුරු එක් කඩකාමරයක් සඳහා කීමනි මුදල රු.50000.00ක් ලෙසත් මාසික කුලි මුදල රු.1000.00 ලෙසත් අය කිරිමටත් මෙම E කඩකාමර මාස 02 කින් වැඩ අවසන් කිරිමටත් එම මාස දෙක සඳහා මාසික කුලී මුදල් අය නොකිරිමටත් එම කඩ කාමර වල වැඩ අවසන් වූ පසු තක්සේරු කටයුතු සඳහා යොමු කිරිම සඳහා කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන කටයුතු කිරිමට සුදුසු බව තීරණය කර ඇත.

නමුත් මෙකි ගොඩනැගිල්ලේ දොරවල් හා ආරක්ෂක වැට නොමැති නිසා බඳුකරුගේ මුදලින් එම කටයුතු සිදු කිරිමට වසර තුනක කීමනි මුදල ප්‍රමාණවත් නොවන නිසා වසර 10කට බඳු දිම අවශ්‍ය බව 2025.11.18 දින ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

එසේම මෙම කඩ කාමර වසර 03 කට වඩා වැඩි කාලයක් සඳහා බදු ලබාදෙන්නේ නම් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (XII) වගන්තිය අනුව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වන අතර 2013 .06.28 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ අති විශේෂ ගැසට්පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 31 (ii) පහත පරිදි වේ.
“කිසියම් කඩ කාමරයක් බද්දට දීම සඳහා ටෙන්ඩර් කැඳවීමේදි එකී කඩ කාමරය සඳහා ගෙවිය යුතු මාසික කුලිය,තීරණය කිරිම,ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව විය යුතුය “

එබැවින් මෙම කඩකාමර සම්බන්ධයෙන් වසර 10කට බදු දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරිමට හා තක්සේරු කිරිමට අනුමැතිය ලබා ගැනීමට හා එසේම ආණ්ඩුකාර අනුමැතියට යොමු කිරිම සඳහා ගිවිසුම් කෙටුම්පතද අවශ්‍ය බැවින් දැනට F ශ්‍රේණියේ කඩ කාමර සඳහා අත්සන් කරනු ලබන බඳු ගිවිසුම් කෙටුම්පත ම E කඩ කාමර සඳහාද ගිවිසුම් ගත වීමට භාවිත කිරීම සඳහා එම ගිවිසුම ඉදිරිපත් කරන අතර ගිවිසුමේ සංශෝධන සිදු කිරිමට ඇත්නම් අවශ්‍ය සංශෝධන සිදුකිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී පී.කේ.ඩී රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා**

මුල් වර්ෂ 3ටම මෙම E කඩ කාමර 13ටම ලැබෙන කීමනි මුදල රු.650,000.00ක් වන බැවින් මෙම කඩ කාමර ලබා ගැනීම සඳහා පුද්ගලයින් විශාල ප්‍රමාණයක් ඉල්ලුම් කරනු ඇතැයිද එවිට මෙම කඩ කාමර ලබාදීමද අපහසු කාර්යයක් වෙතැයි ද එබැවින් කීමනි මුදල වැඩි කළ යුතු බවත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

බිබිල සතිපොළ E කඩ කාමර 13 ,වසර 10ක් සඳහා බඳු ලබා දීමටත් එම කඩ කාමරයක් සඳහා කීමනි මුදල රු.1,000,000.00 බැගින් අය කිරීමටත් ඒ සඳහා මාසික කුලිය රු.1700.00ක් ලෙස අය කිරීමටත් එම කඩ කාමර ලබා ගැනීමට කැමති නම් පැරණි බඳුකරුවන් හට ඉදිරිපත් වන ලෙස ලිපි මගින් දැනුම්දීමටත් මෙම කඩ කාමර ලබා ගැනීමට කැමති පැරණි බඳුකරුවන් පළමුව බඳු ලබා දීමටත් එසේ ලබා දී තවත් කඩ කාමර ඉතිරි වේ නම් ඉල්ලුම් කරනු ලබන නව බඳු කරුවන් හට බඳු ලබාදීමටත් මෙම කඩකාමර සම්බන්ධයෙන් වසර 10කට බදු දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරිමට හා තක්සේරු කිරිමට අනුමැතිය ලබා ගැනීමට හා එසේම ආණ්ඩුකාර අනුමැතියට යොමු කිරිම සඳහා ගිවිසුම් කෙටුම්පතද අවශ්‍ය බැවින් දැනට F ශ්‍රේණියේ කඩ කාමර සඳහා අත්සන් කරනු ලබන බඳු ගිවිසුම් කෙටුම්පත ම E කඩ කාමර සඳහාද ගිවිසුම් ගත වීමට භාවිත කිරීමට සුදුසු බවත් තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.16.මුදියල ආයුර්වේද සායනික ගොඩනැගිල්ල නාය යෑමට අදාලව ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2026.01.06 දිනට නියමිතය. 2025.11.26 දින පැවති ආපදා තත්වය හේතුවෙන් නායයෑමට ලක්වූ මුදියල ආයුර්වේද සායනික මධ්‍යස්ථානයට අයත් ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා**
මුදියල ආයුර්වේද සායනික මධ්‍යස්ථානය සහිත අක්කර ½ක් පමණ වන ඉඩම පහළට ගිලා බැස ඇති බවත් තමා නිරීක්ෂණය කළ බවත් පැවසීය.

මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ආපදා කළමණාකරන ඒකකයට දැනුම්දී ඇති බව මූලාසනය විසින් ගරු සභාව දැනුම් දෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

මූදියල ආයුර්වේද සායනික ගොඩනැගිල්ල 2025.11.26 දින පැවති දිට්වා සුළි කුණාටුව හේතුවෙන් නාය යෑම නිසා ගිලා බැස ඇති බව ආපදා කළමණාකරන ඒකකය වෙත දැනුම්දී ඇති බැවින් එම ආයතනය විසින් නිරීක්ෂණය කර එම නීතිමය කටයුතු ඉටුකර ගැනීමෙන් පසු එම සායනික මධ්‍යස්ථානයට අයත් ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ ලේඛන වලින් ඉවත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17. කඩ කාමර බදු ගිවිසුම්කරුවන් ජීවත්ව සිටින බවට සහතික ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශිය සභාවේ සියළුම කඩ කාමර බදු ගිවිසුම්කරුවන් ජීවත්ව සිටින බවට සහතිකයක් වර්ෂයකට වරක් ක්ෂේත්‍ර පරික්ෂණයක් මඟින් ලබා ගැනීමට අනුමැතියක් ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

කඩකාමර බඳු ගිවිසුම්කරුවන් ජීවත්ව සිටින බවට තොරතුරු රැස් කිරීම සඳහා ආදායම් පරීක්ෂක මහතා ඇතුළුව කමිටුවක් පත් කිරීමට සහා ලේකම්තුමියට භාර දීමටත් එම බඳුකරුවන් පිළිබඳව හා අතුරු බඳු ලබාගෙන ඇති අතුරු බඳුකරුවන්ගේ විස්තරද රැස් කිරීමට කටයුතු කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18. 2026 වර්ෂයේ සභා කටයුතු පවත්වාගෙන යාම සඳහා කමිටු පත් කිරීම හා කාරක සභා සඳහා බලතල පැවරීම.

බිබිල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ සභා කටයුතු පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් කමිටු සඳහා සාමාජිකයින් පත්කිරිමට හා එම කාරක සභා සඳහා බලතල පැවරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව
02. නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාව
03. කාර්මික සේවා පිළිබඳ කාරක සභාව
04. පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 01.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව

මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව සඳහා, ගරු සභාපතිතුමා ඇතුළු පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් ධායකයින් සුදුසු බව හා එම කාරක සභාවට පැවරෙන කාර්ය, කර්තව්‍ය හා බලතල ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති වී.සරත් විදානගමගේ මැතිතුමා | - | සභාපති |
| 02. ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | සාමාජික |
| 03. ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා | - | සාමාජික |
| 04. ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | සාමාජික |
| 05. ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා | - | සාමාජික |
| 06. ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය | - | සාමාජික |
| 07. ගරු මන්ත්‍රී ඩී.ඒ.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | සාමාජික |

හා සම්පත් දායකයින් ලෙස

| | | |
|---|---|---|
| 01. කේ.එච්.එම්.විජේරත්න මහතා | - | විශ්‍රාමික ඌව සංවර්ධන බැංකු කළමණාකරු |
| 02. ඩබ්.ඒ.හර්බට් රත්නවීර මහතා | - | විශ්‍රාමික ඌව සංවර්ධන බැංකුවේ ක්ෂේත්‍ර නිළධාරි |
| 03. එච්.එම්.පියදාස මහතා | - | විශ්‍රාමික බැංකු නිළධාරි |
| 04. කේ.ඩී.එම්.විජේ දස්කොන් මහතා | - | විශ්‍රාමික බිබිල ශ්‍රී ලංගම කළමණාකරන සේවා නිළධාරි |

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

**i.**ප්‍රාදේශිය සභා පනතේ II වන, III වන, IV වන, V වන සහ VI වන කොටස් සම්බන්ධයෙන් මහා සභාව විසින් අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම.

ii.වරිපනම් සියළුම බදු හා ගාස්තු නියම කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**iii.**අළුත් ආදායම් වර්ග හඳුනා ගැනීම හා ආදායම් පැනවීම පිළබඳව මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**iv.**ආදායම් රැස් කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**v.**අයකර ගත නොහැකි ආදායම් කපාහැරීම පිළිබඳව අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා වන නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vi.**විනෝද බදු ආඥා පනතේ 2 වගන්තිය යටතේ විනෝද බදු පැනවීමට අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vii.**ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල මුදල් පිළිබඳ කාර්ය හා සම්බන්ධව අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**viii.**ප්‍රාදේශීය සභාව සතු දේපල බදුදීම, කුලියටදීම, බැහැර කිරීම හෝ වෙනත් ආකාරයක ගනුදෙනු පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග කවරේද යන්න නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ix.**ප්‍රාදේශීය සභාවට දේපල අත්පත් කරගැනීම හා මිලදී ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**x.**ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන වෙනත් මුදල් ගනුදෙනු කාර්ය පිළිබඳ තීරණ සඳහා අදාල නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xi.**සෙසු කාරක සභා විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට කෙරෙන නිරීක්ෂණ සලකා බලමින් ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xii.**ප්‍රාග්ධන භාණ්ඩ හා තොග භාණ්ඩ හෝ ද්‍රව්‍ය මිලදී ගැනීම ,ගබඩා කිරීම, නිකුත් කිරීම හා අවම තොග මට්ටම් පවත්වා ගැනීම සිදු කිරිමේදි අනුගමනය කළයුතු ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xiii.**වාර්ෂික භාණ්ඩ හා තොග සමීක්ෂණ කාර්ය සිදු කිරීම පිළිබඳ ප්‍රගතිය මැන බැලීම සහ එහිදී අනුගමනය කළයුතු ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xiv.**එක් එක් වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගනු ලබන අබලි භාණ්ඩ අලුත්වැඩියා කිරීම, විකිණීම හෝ විනාශ කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xv.**ප්‍රාග්ධන භාණ්ඩ හෝ තොග ඌණතා පිළිබඳව විමර්ෂණය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xvi.**ප්‍රාග්ධන භාණ්ඩ වලට හෝ තොග භාණ්ඩ වලට සිදුවන හානි හෝ අඩුපාඩු පිළිබඳව විමර්ශනය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xvii.**ගබඩා කළමණාකරනයේදී අනුගමනය කළයුතු ක්‍රමෝපාය අධ්‍යනය කිරීම හා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xviii.**ප්‍රාදේශීය සභාව සතු වත්කම් වල නාස්තිය හා දූෂණය අවම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xix.**ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇති කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේදි සිදුවිය හැකි වියදම් අවම කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xx.**ප්‍රාදේශීය සභාවේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxi.**ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තනතුරු හා ධූර ඇති කිරීම පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස අධ්‍යනය කර මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**xxii.**ප්‍රාදේශීය සභාවට අවශ්‍ය බවට ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ කෙරෙන තනතුරු හා ධුර පළිබඳව වැටුප් ,දීමනා හෝ පාරිශ්‍රමික නියම කිරීමට හැකිවනු පිණිස අධ්‍යනය කර මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**xxiii.**ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ගමන් වියදම් හෝ පරිවර්තිත ගමන් වියදම් සීමා නියම කිරිම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxiv.**ප්‍රාදේශීය සභා සභිකයන්ගේ සහ නිළධාරීන්ගේ නිවාස දුරකතන සැපයීම සහ සුහසාධනය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxv.**ප්‍රාදේශීය සභාවේ කාර්යයන්ට අදාළව මහ සභාව විසින් පවත්වාගතයුතු දත්ත හා සංඛ්‍යා ලේඛන කවරේද යන්න තීරණය කිරීම.

**xxvi.**දේශීය සභාවේ ලිපි ලේඛන වල ආරක්ෂාව සහ ලේඛනාගාර පිළිබඳව මහා සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**xxvii.**ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයට කාර්ය පැවරිම හා ඒවා සමාලෝචනය පිණිස අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxviii.**ප්‍රාදේශිය සභාවට අදාළ නීති කෘත්‍ය පිළිබඳව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxix.**ප්‍රාදේශීය සභාව විසින් පනවා ගතයුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස්කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxx.**ප්‍රාදේශීය සභාව විසින් ඉටුකළ යුතු සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළත් යෝජනා ඇතුළත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxxi.**සභාව විසින් අනුමත කළ සංයුක්ත සැලැස්මට අනුව එක් එක් වර්ෂයේ මූල්‍ය සැලැස්මට අනුව සමගාමීව සංවර්ධන යෝජනා ප්‍රමුඛගත කිරීම, වාර්ෂික සංවර්ධන සැලැස්ම කෙටුම්පත් කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxxii.**සභාව විසින ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වල / කර්මාන්තවල ප්‍රගතිය වරින් වර විමර්ශනය කිරීම , ඒ සභා කළයුතු අත්‍යාවශ්‍ය වෙනස්කම් හෝ සංශෝධන සහ අනුගමනය කළයුතු වෙනත් ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xxxiii.**අවශ්‍ය අවස්ථාවක දී වාර්ෂික සංවර්ධන සැලැස්මට කළයුතු වෙනස්කම් හෝ සංශෝධන පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 02. නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාව

නිවාස හා ප්‍රජා සංවර්ධන පිළිබඳ කාරක සභාව සඳහා ගරු උප සභාපතිතුමා ඇතුළු පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් ධායකයින් සුදුසු බව හා එම කාරක සභාවට පැවරෙන කාර්ය, කර්තව්‍ය හා බලතල ගරු මන්ත්‍රී ඩබ්. එම්.රූපසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

01 . ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා - සභාපති

02. ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය - සාමාජික
03. ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා - සාමාජික
04. ගරු මන්ත්‍රී ඩබ්.එම්. එම්. අසංක වාසළ මැතිතුමා - සාමාජික
05. ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා - සාමාජික
06. ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා - සාමාජික
07. ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය - සාමාජික

හා සම්පත් දායකයින් ලෙස,
01 .ඩබ්.ආර්.නිමල් රණවීර මහතා - විශ්‍රාමික සභා ලේකම්
02. ජේ.ඒ.ප්‍රේමලාල් වන්නිසිංහ මහතා - සමෘද්ධි කළමණාකරු
03. ඩී.එම්. විජේවික්‍රම මහතා - විශ්‍රාමික හමුදා නිළධාරි
04. ජේ.ඩබ්.එම්.ජයසිංහ මහතා - සංචාරක උපදේශක

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

**I.**අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික ,සාමාජීය හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ii.**සභා බල ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන සංවිධාන ඇති කිරීම, පවත්වාගෙන යාම, ඒ සංවිධාන ශක්තිමත් කිරීම සහ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යයන්ට ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීමට අනුගමනය කළයුතු ක්‍රමෝපාය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**iii.**සභා බල ප්‍රදේශ තුළ ජීවත්වන ආබාධිත තැනැත්තන් පුනුරුත්ථාපනය කිරීම හා ඒ පිළිබඳ අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**iv.**සභා බල ප්‍රදේශය තුළ පොදු උත්සව ,සංස්කෘතික ක්‍රියාකාරකම් , ආගමික උත්සව හා ප්‍රජා පිළිගැනීම් සංවිධාන කිරීම, දහම් පාසල්වල කාර්ය ප්‍රවර්ධනය සහ පොදු විනෝද කටයුතු සංවිධානය කිරීම පිළිබඳ ව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**v.**සභා බල ප්‍රදේශය තුළ පොදු වෙළඳපොළ සහ සති පොළ පැවැත්වීම පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vi.**සභා බල ප්‍රදේශය තුළ ක්‍රීඩා භූමි සහ ක්‍රීඩාගාර ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**vii.**සභා බල ප්‍රදේශය තුළ ප්‍රජාශාලා හා උත්සව ශාලා ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**viii.**ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන මහජන පුස්තකාල පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**ix.**මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ ඇතිකිරීම ,ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහාය ලබාදීමට අදාළ නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**x.**බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජ්‍යේෂ්ඨ පුරවැසි සංවිධාන සමඟ සමීපව සම්බන්ධ වෙමින් ජ්‍යේෂ්ඨ පුරවැසියන්ගේ පහසුව සුභසාධනය සඳහා අවශ්‍ය නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xi.**සභා බල ප්‍රදේශය තුළ ඇතිවිය හැකි ගිනි ගැනීම් වැලැක්වීම හා ගිනි නිවාරණය පිළිබඳව ආසන්න පළාත් පාලන ආයතන සමඟ එකඟතා ඇතිකර ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

**xii.**සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන දිළිඳු කැනැත්තනට උපකාර කිරීම සහ ජනතාවගේ ආපදා අවස්ථා කළමණාකරනය පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 03.කාර්මික සේවා පිළිබඳ කාරක සභාව

කාර්මික සේවා පිළිබඳ කාරක සභාව සඳහා ගරු උප සභාපතිතුමා ඇතුළු පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් ධායකයින් සුදුසු බව හා එම කාරක සභාවට පැවරෙන කාර්ය, කර්තව්‍ය හා බලතල ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.

01 .ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා - සභාපති
02. ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා - සාමාජික
03. ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා - සාමාජික
04. ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා - සාමාජික
05. ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා - සාමාජික
06. ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා - සාමාජික
07. ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා - සාමාජික

හා සම්පත් දායකයින් ලෙස
01 .වයි.කේ.ඩී.එම්. කෝට්ටේගොඩ මහතා - ව්‍යාපාරික
02. ඩබ්.එම්.ලලිත් රූපසේන මහතා - වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශක
03. එස්.ඒ.බී.පුලස්ති රංගනාත් මහතා - වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශක
04. ජේ.ඒ.විමලසේන මහතා - විදුහල්පති සේරුව ප්‍රාථමික විදුහල

(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල

I. සභාව ඉඩම් පරිපාලනය පිළිබඳව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

ii. වීථි හා මාර්ග සම්බන්ධව ප්‍රාදේශීය සභාව සතු බලතල,කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළයුතු ක්‍රමවේද පිළිබඳව නිරීක්ෂණය හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව මගින් මහා සභාවට ඉදිරිපත් කිරීම.

iii. වීථි මාර්ග නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා ප්‍රසිද්ධ අධ්‍යන ආදිය නම් කිරීම පිළිවෙලින් ප්‍රාදේශීය සභා පනතේ 32(ඇ) වන සහ 198 වන වගන්ති යටතේ මහා සභාව විසින් ගනු ලැබිය යුතු තීරණ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

iv. වීථි අවහිර කිරීම, වීථි ආදියට හානි පැමිණවීම, අයුතු ඇඳා ගැනීම්, වීථිවල කටයුතු වලට බාධා වන ගස් සහ අනතුරුදායක ගස් හෝ අතු හෝ කඳන් හෝ ගෙඩි ඉවත් කිරීම පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

v. බල ප්‍රදේශය තුළ නව වීථි මාර්ග ඇති කිරීම හෝ මාර්ග පුළුල් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

vi. සභා බල ප්‍රදේශය තුළවීථි රේඛා නියම කිරීම, වෙනස් කිරිම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

vii. වීථිවල කෙරෙන කරදර ආදිය පාලනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

viii. විශේෂ කාර්ය සඳහා වීථි ප්‍රයෝජනයට ගැනීම සහ සභා බල ප්‍රදේශයේ වීථිවල පවතින බාධක හා ප්‍රසර්පණ ඉවත් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

ix. සභා බල ප්‍රදේශය තුළ පවත්නා අනවසර ඉදිකිරීම් පාලනය , නීත්‍යානුකූල කිරීම හෝ ඉවත් කිරීම සහ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත මඟින් ප්‍රාදේශීය සභාවට පැවරෙන කාර්ය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

x. වීථි හා පොදු ගොඩනැගිලි ආලෝකකරණය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

xi. දේශීය සභා බල ප්‍රදේශය තුළ සියළුම වීථි, මාර්ග, මංමාවත්, පටුමංවල රථවාහන ගමනාගමනය නියාමනය හා පාලනය කිරීම පිළිබඳව මහා සභාවේ තීරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යනය කර නිර්දේශ වාර්ථා ඉදිරිපත් කිරීම.

xii. ඉඩම් කට්ටි කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සැලසුම් හඳුනා ගෙන උචිත බලධාරියා වෙත නිර්දේශ කිරීමට මහා සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

xiii. සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වල/ කර්මාන්තවල කාර්ය සඳහා ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

xiv. ප්‍රාදේශීය සභාව සතු මාර්ග සහ ඉඩම් පිළිබඳව දත්ත පද්ධතිය කලින් කල සමාලෝචනය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරිම.

xv. සභාව සතු මාර්ග ,ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා අලුත්වැඩියා කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

## 04. පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව

පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව සඳහා පහත මන්ත්‍රී මණ්ඩලය හා සම්පත් දායකයින් සුදුසු බව හා පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

01 .ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංගලිකා මැතිතුමිය - සභාපති
02. ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා - සාමාජික
03. ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතමා - සාමාජික
04. ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය - සාමාජික
05. ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි මැතිතුමා - සාමාජික
06. ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්පකුමාර මැතිතුමා - සාමාජික
07. ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා- සාමාජික

හා සම්පත් දායකයින් ලෙස
01 . බී.එම්.ප්‍රේමවර්ධන මහතා - විශ්‍රාමික විදුහල්පති
02. කේ.එම් නන්දසේන මැතිතුමා - පාසල් ගුරු
03. සී.ඩබ්.ඒ. ඩිංගිරි බණ්ඩා මහතා - විශ්‍රාමික විදුහල්පති
04. ඩබ්.එම්. වූලරත්න මහතා - සමාජ ක්‍රියාකාරී

**(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය හා බලතල**

**I.** මාතෘ හා ළමා සෞඛ්‍ය නැංවීම ,බටහිර වෛද්‍ය සායන සහ ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**ii.** මදුරුවන් හෝ වෙනත් කෘමි සතුන් බෝවීම, ඒ මඟින් රෝග බෝවීම පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**iii.** මහජන පීඩා වැලැක්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**iv.** නිවාසවල ඇති කරන සහ දඩාවතේ යන සුනඛයන් වන්නත් කිරීම , සුනඛ ගහනය පාලනය කිරීම හා ජලභීතිකා රෝගය පාලනය කිරීම වැලැක්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**v.** ආසාදන රෝග හා වසංගත රෝග මර්ධනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**vi.** වැසිකිලි සහ වසුරු වලවල් විධිමත් කිරීම , පාලනය හා ගලි බවුසර් සේවා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**vii.** ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ අතුරු ව්‍යවස්ථාවලින් සභාවට බලය ලැබී ඇති කාර්ය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**viii.** සුසානභූමි හා ආදාහනාගාර විධිමත් කිරීම හා පාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**ix.** සභා බල ප්‍රදේශය තුළ රැස් කරනු ලබන කසළ රැස් කිරීම , ප්‍රවාහනය, පිරියම් කිරීම,අවසන් බැහැර කිරීම සහ කාණු පිරිසිදු කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

**x.** අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය මිලට ගැනීම 7R System ) සහ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභා මඟින් මහ සභාවට ඉදිරිපත් කිරීම.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

මෙම කාරක සභා වලින් තීන්දු තීරණ ගැනීමේදී විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස්ද වැදගත් වන බැවින් කාරක සභා පත් කිරීමේදී සම්පත් දායකයින් පත් නොකර පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සමානුපාතිකව පත්කරන්නේ නම් සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.අසංක වාසළ මැතිතුමා</u>

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් සම්පත් දායකයින් නොමැතිව කාරක සභා පත් කළ හැකි බව පැවසුවද බාහිර සමාජයේ පුද්ගලයින් පත්කර බලාපොරොත්තු වන්නේ බිබිල ප්‍රාදේශීය සභාව පිළිබඳව මහජනයා තුළ අවබෝධයක් ගොඩනැගීම සඳහා ය. ප්‍රාදේශීය සභාවේ ක්‍රියා කලාපය, වැඩපිළිවෙල පිළිබඳ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාට අවබෝධයක් තිබුණද බාහිර සමාජය ඒ පිළිබඳව අවබෝධයක් නොමැති බැවින් ඒ පිළිබඳව අවබෝධයක් ඇති කිරීම සඳහාත් එසේ අවබෝධයක් ජනතාව තුළ ගොඩනැගීමේදී මන්ත්‍රී මණ්ඩලය කරනු ලබන පැහැදිලි කිරීම්වලට වඩා සම්පත් දායකයින් බාහිර සමාජ පුද්ගලයින් බැවින් එම පැහැදිලි කිරීම් ජනතාව පිළිගන්නා බවයි.

<u>ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා</u>

මෙම කමිටු සඳහා සම්පත් දායකයින් හා මන්ත්‍රී මණ්ඩලය පත් කර ගනු ලබන්නේ විපක්ෂය ලෙස සලකා බේදයක් හෝ ගැටලුවක් ඇති කිරීමට නොවන බවත් මේ අය ක්ෂණිකව කැඳවීමට පහසු හා සක්‍රීයව දායකත්වය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් බවත්ය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>05.01.19. බිබිල ප්‍රාදේශීය සභාවේ රියදුරු විවේකාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.2,000,000.00 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

බිබිල ප්‍රාදේශීය සභාවේ රියදුරු විවේකාගාරය මේ වන විට ඉදිකිරීම් සිදුකර ඇතත් එම විවේකාගාරයේ වැඩ සම්පූර්ණ නිමකර නැත. මෙම ආයතනයේ සේවය කරන රියදුරන් සඳහා දිවා ආහාර ගැනීමටවත් ස්ථානයක් නොමැති බැවින් එම විවේකාගාරයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.2.000,000.00 ක ඇස්තමේන්තුවකට අනුව සහා අරමුදලින් වැයකර ඉදිකිරීමට අනුමැතිය ලබාදීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

රියදුරු මහතුන්ගේ ඉල්ලීම සාධාරණ බවත් එසේ වුවද මෙම අවස්ථාවේ සභාවේ අරමුදල් පිළිබඳ සලකා බලා රියදුරු මහතුන්ගේ විවේකාගාරය සඳහා රු. 2.000,000.00 ක මුදලක් වැය නොකර ඒ අය සඳහා වෙනත් ස්ථානයක් ලබාදීමට සුදුසු බව පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

මෙම ඉදිකිරීම සඳහා පුහුණු ශ්‍රමය වන පෙදරේරු ,වඩු බාස්ලාගේ ශ්‍රමය හා අවශ්‍ය ද්‍රව්‍ය මුදලින් ලබා ගන්නා බවත් අනෙකුත් ශ්‍රමයන් සභාවේ කම්කරු මහතුන්ගෙන් ලබා ගෙන ඉදිකිරීම් කටයුතු සිදු කරන බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

ටෙන්ඩර් පටිපාටියකින් තොරව දෛනික වැටුපට පුහුණු ශ්‍රමය ලබාගෙන ඉදිකිරීම් කටයුතු සිදු කරන්නේ නම් තමා එකඟ වන බවත් සභාවේ වැඩ කටයුතු සිදුකිරීම සඳහා පුහුණු පෙදරේරු මහතුන් දෙදෙනෙකු බඳවා ගන්නේ නම් සුදුසු බවත් පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.</u>

- 2025.11.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව

මෙම ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.

2025 නොවැම්බර් මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 7,356,922.64 |
| මූලධන ලැබීම් | - රු. 2,664,147.37 |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 1,998,970.07 |
| මුළු ලැබීම් | - රු.12,020,040.08 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 8,423,153.14 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 2,193,169.62 |
| ණය ආපසු ගෙවීම් | - රු. 203,873.00 |
| වෙනත් වියදම් | - රු. 2,090,537.72 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු. 12,910,738.48 |

**2025.11.30 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 16,944,183.20 |
| අක්කර බදු | - රු. 6,354.34 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 1,998,903.50 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 703,442.00 |
| කුලී මුදල් | - රු 1,897,166.17 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 3,321,179.59 |
| එකතුව | - රු 24,871,228.80 |

## 08.වෙනත් කරුණු

**ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති සමරකෝන් මැතිතුමිය අදහස් දැක්වීම.**

මහියංගන පාර 5 කණුව නිකේතනය මාර්ගයේ සුසානභූමිය අසල 100m පමණ ප්‍රමාණයක් කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා මේ සඳහා රු.2,000,000.00 මුදලක් වෙන් වී ඇති බව දැනුවත් කළද එය සිදුවන ආකාරය පිළිබඳ තමාට දැනගත යුතු බවත් එම ස්ථානයට වීථි ලාම්පුවක් ස්ථාපිත කරන ලෙස ඉල්ලුම් කළද එය මේ වන තෙක් සිදු කර නොමැති බැවින් ඒ පිළිබඳව ගරු මූලාසනයේ අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කළාය.

වැගම උතුර නිවාස 20 දෙහිගල ලන්ද මාර්ගයේ කඳුර කඩා ගෙන යාම නිසා එම ප්‍රදේශයේ මිනිසුන් අසරණව සිටින බවත් එම මාර්ගය පිළිබඳව නිරීක්ෂණය කර සුදුසු පියවරක් ගන්නා ලෙසත් මෙම දිට්වා සුළි කුණාටුවෙන් දෙහිගලවත්ත මාර්ගයට පස් කඩා වැටී ගමන් කිරීමට නොහැකි තත්වයට පත්ව ඇති නිසා එම මාර්ගයේ පස් ඉවත් කර යම් තාක් දුරට හෝ ප්‍රතිසංස්කරණය කරදෙන ලෙසත් 05.01.18

යෝජනාව යටතේ පත්කළ කාරක සභා සඳහා ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමාගේ නම යෝජනා නොවූ බවත් එතුමා කාරක සභාවකට ඇතුළත් වියයුතු මන්ත්‍රීවරයෙකු බැවින් එතුමාද එම කාරක සභාවකට ඇතුළත් කරන ලෙස ඉල්ලීමක්ද කරන ලදී.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වීම.**

2025 12.05 දින පැවති විශේෂ මහ සභා වාරයේ දී මා හෘද සාක්ෂිය පිළිබඳ කතා කළේ ආදාහනාගාරය විවෘත කිරීමේදී මුහුණු පොතේ සඳහන් වූ කරුණු වල පසුගිය සභාවේ සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කර නොතිබුණු නිසා බවත් දැනට මෙම ප්‍රාදේශීය සභාවට ආදායම්උත්පාදන මාර්ගයක් බවට මෙම ආදාහනාගාරය පත්වූයේ එම හිටපු සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලයේ තීරණයක් නිසා බවත් ඒ අය සඳහා ගෞරවයක් හිමිවිය යුතුබව තමා පෞද්ගලිකව සිතන බව පැවසීය.

මම එසේ ප්‍රකාශ කළේ මෙම සභාපතිතුමා හා ජාතික ජනබලවේග ආණ්ඩුවේ මන්ත්‍රී මණ්ඩලය අපහසුතාවට පත් කිරීමට නොව තමාගේ හෘද සාක්ෂියට අනුව පසුගිය සභාවේ සභාපතිතුමාට හා මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කළයුතු බව සිතන බැවින් බවත් තමන්ගේ පක්ෂය කුමක් වුවත් තමන්ට හෘද සාක්ෂියක් තිබෙන බැවින් බවත් හෘද සාක්ෂියට එරෙහිව යම් දෙයක් සිදුකළහොත් නින්දට යන මොහොතේ හෝ ඒවා සිහිවන බවත් පශ්චස්තාපයට පත්වීමට සිදුවන බවයි.

හිටපු ජනාධිපතිවරු පිළිබඳ ස්වභාවධර්මයා නඩු ඇසූ කාලයක් බව ජනතාව තුළ මතයක් ගොඩනැගී තිබුණු බවත් නූතන ජනාධිපතිතුමාගෙනුත් බිබිල ප්‍රාදේශීය සභාවේ ජනතා නියෝජිතයින් වන මේ සියළු දෙනාගෙන් ද ස්වභාව ධර්මයා නඩු අසන බවත් එදිනට තමන් උත්තර බැදිය යුතු බවත් එම නිසා හෘද සාක්ෂියට අනුව කටයුතු කර නිවැරවදිදේ කර තිබීම සුදුසු බව පෙන්වා දුන්නේය.

තමා දියකොලයාය මාර්ගය කැපීම සඳහා යෝජනා කළ අවස්ථාවේ සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති බව පවසා ප්‍රතික්ෂේප කළද සභාවේ ප්‍රතිපාදන නොමැතිව තිබියදී වුවද ආදාහනාගාරයේ තාප්පය ඉදිකිරීමට රු.1,100,000.00 ක් සභා අරමුදලින් ඇස්තමේන්තුගත මුදලට වඩා යෙදවීමට කැමතිවූයේ තාප්පය බැඳීම සඳහා වැරදි ලෙස සැලසුම් සකස් කළ කාර්මික නිළධාරියා බේරා ගැනීමට බවත් එබැවින් හෘද සාක්ෂියට අනුව එය වැරදි තීරණයක් බවත් පැවසීය.

දූෂණය ,වංචාව නැතිකර මහජනතාවට සේවය කිරීම සඳහා පත්වූ ජාතික ජනබලවේග ආණ්ඩුව අත්තනෝමතික ලෙස තීරණ ගනු ලැබූ කාර්මික නිළධාරියා ආරක්ෂා කිරීමට තීරණ ගනු ලැබූ බවත් එසේ නම් කෙදිනකද මෙම කාර්මික නිළධාරි නිවැරදි කරන්නේ යැයි ප්‍රශ්න කළ මන්ත්‍රීතුමා මේ සියළු මන්ත්‍රීවරුන්ට තමන්ගේ හෘද සාක්ෂියට අනුව නිවැරදි තීරණ ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස ගරු මූලාසනයෙන් ඉල්ලුම් කරමින් මෙම මන්ත්‍රීවරුන් අතරේ සිටින ගුරුවරුන්ගේ ආත්ම ගෞරවයට හානියක් නොවන ආකාරයෙන් තීරණ ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස ද ගරු මූලාසනයෙන් ඉල්ලා සිටින ලදී. හෘද සාක්ෂියට එකඟව කටයුතු නොකරන්නේ නම් ස්වභාවධර්මය නඩු අසන විට මන්ත්‍රී මණ්ඩලය චූදිතයෝ නොවියයුතු බවත් එබැවින් හෘද සාක්ෂියට එකඟව තීරණ ගෙන කටයුතු කළයුතු බව ද පැවසීය.

**ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා අදහස් දැක්වීම.**

මල්දම්අඹේ සුසාන භූමියේ ගම්මිරිස් සිටුවීමට කොටු 1000ක් පමණ සිටුවා තිබුණු බවත් පැලක් ඉදිකිරීමට සේ කණු 04කුත් සිටුවා තිබුණු බවත් ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට දැනුවත් කර ඇත්දැයි ඇසූ ගරු මන්ත්‍රීතුමා ඒ පිළිබඳ සොයා බලන ලෙස පැවසීය.

අබේලන්ද මාර්ගය දෙපස තණකොළ පාරට වැටී ඇති බැවින් ගමන් කිරීමට අපහසු බවත් එබැවින් එම තණකොළ කපා ඉවත් කරන ලෙසද ගරු මූලාසනයෙන් ඉල්ලුම් කරන ලදී.

කාරක සභා සඳහා තමන් පත් නොකිරීම පිළිබඳව හා එම කාරක සභා සඳහා තමන් පත් කරන ලෙස ගරු මනත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය මතක් කිරීම පිළිබඳව ස්තූති කළ අතර එම කමිටු සඳහා තමන් පත්වීමට කැමති නැති බවත් එම කමිටු සති අන්ත දිනවල පැවැත්වුවහොත් ඒ සඳහා සහභාගි වුවහොත් තමාට ආර්ථිකමය වශයෙන් පාඩුවක් සිදුවන බවද පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය අදහස් දැක්වීම.</u>

ගරු මනත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය පැවසූ වැගම උතුර දෙහිගලලන්ද මාර්ගයේ කැඩී ඇති බෝක්කුව පිළිබඳව වසමේ අදාළ නිළධාරි , අමාත්‍යතුමාව දැනුවත් කර ඇති බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට ද ලිපිලේඛන සකස් කර ඇති බවත් දිට්වා සුළි කුණාටුව නිසා සිදුවූ ආපදාවක් වූ දෙහිගලවත්ත මාර්ගය පස් වලින් යටවී තිබීම නිසා එම මාර්ගයේ පස් හා ගල් ඉවත් කිරීමට JCB යන්ත්‍රය දින 2ක් යෙදවූ බවත් එම ප්‍රදේශයේ ජනතාවගේ සුවදුක් විමසීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ගොස් එම ජනතාවට අවශ්‍ය ද්‍රව්‍යාධාර උදවු උපකාර සිදුකළ බව පැවසීය.

ප්‍රදේශයේ ජනතාවට තේ දළු නෙලීමට යෑමට හැකිවන ආකාරයට මාර්ගයේ පස් ඉවත් කළද විශාල ගලක් එම මාර්ගය මධ්‍යයේ තිබීම නිසා ඉවත් කිරීමට නොහැකිව තිබෙන බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමිය මෙම මාර්ගය ඉදිකිරීමට ප්‍රමුඛතාවය ගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී. පේරගස්පිටිය මාර්ගය ගල්කුඩු යොදා හෝ සාදා දෙන ලෙස ගම්වාසීන් ඉල්ලා සිටින බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී. සමස්ථ වශයෙන් මෙම කුණාටුවෙන් විශාල විනාශයක් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වසම් 40 හිම සිදු නොවූවත් ගමන් කිරීමට නොහැකි ලෙසම පාලම් ,බෝක්කු කිහිපයක් විනාශවී ඇති බවත් සියළු දෙනාම එක්ව ඒවා ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරමු යැයි පැවසීය.

බිබිල ප්‍රදේශයේ අහිංසක ජනතාව නියෝජනය කරමින් ජනතා නියෝජිකයින් ලෙස තේරී පත්ව සිටින බවත් එබැවින් එම ජනතාවට ඒ අයගේ දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් බෙදීමකට නොගොස් එකාවන්ව එක්ව පියවරෙන් පියවර බිබිල ප්‍රාදේශීය සභාව ඔසවා තබමු යැයි පැවසීය. මෙම සභාවේ වාද විවාද කිරීමට බෙදීමකට යාම පිළිබඳව තමා පිළිකුලෙන් යුතුව හෙලා දකින බවත් සුබ විහරණය සඳහා වැය කරනු ලබන වියදම් සියල්ල ඉවත් කර මෙම ව්‍යසනය නිසා විනාශයට පත්වී ඇති දේවල් නැවත නගා සිටුවීමට සියළු දෙනා එක්ව සාමූහිකව කටයුතු කර බිබිල ප්‍රාදේශීය සභාව උත්තරීතර සභාවක් කරමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වීම.</u>

දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් වූවන් පිළිබඳව සියළු දෙනාම ශෝකයට පත්වූවා සේම මෙම අවස්ථාවේදී රටේ සියළු ජනතාව පාට පක්ෂ භේද දුරලා මනුෂ්‍යත්වය ඉදිරියට ගෙන කටයුතු කළ බවයි. දිට්වා සුළි කුණාටුවෙන් කඳුකර ප්‍රදේශවල සිටි ජනතාව සඳහා විශාල වශයෙන් ජීවිත හානි සිදුවූ බවත් තැනිතලා ප්‍රදේශවල සිදුවූයේ දේපල හානි බැවින් මෙම කඳුකරයේ නාය යන ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් බිබිල බලප්‍රදේශයේ ප්‍රධාන මාර්ග වලට මුහුණලා ඇති වනාන්තර ප්‍රදේශවලින් පර්චස් 20 බැගින් හෝ ඒ අයට ලබාදීමට කටයුතු කරන්නේ නම් සුදුසු බවත් එම ස්ථාන ලෙස බිබිල මඩකලපුව මාර්ගය, පිටකුඹුර ඉලුකාපතන මාර්ගය, බිබිල බුළුපිටිය මාර්ගය යන මාර්ග වලට මුහුණලා ඉඩම් ඇති බවද එම ස්ථාන පිළිබඳව තොරතුරු සොයා බලා ඉඩම් ලබාදීමට කටයුතු කරන්නේ නම සුදුසු බව පවසන ලදී.

එසේම ආදාහනාගාරයේ යතුරු ආදාහනාගාරයේ කටයුතු අවසන්වූ පසු පොලීසිය භාරයේ පැවතියයුතු බවද පැවසීය. බිබිල ප්‍රදේශයේ බොහෝ දරුවන් ළඟ පෙළ පොත් තිබෙන බැවින් ඒවා නිසි ක්‍රමවේදයකට එකතුකොට එම දරුවන් හට බෙදාදීමට සුදුසු බව ද ප්‍රකාශ කරන ලදී.

අනාගතයේදී බිබිල නගරය සංචාරක නගරයක් බවට පත්කිරීමට නියමිත බැවින් අතීතයේදී බිබිල පොලීසිය පැවති ස්ථානයේ පැරණි කොටගම වලව්ව සහිත ඉඩම මේ වන විට කැබලි කර විකුණන බවත් එමගින් බිබිල ප්‍රාදේශීය සභාවටඉඩම් කොටස් කිරීමේදී ඉඩම් කොටසක් හිමිවන බැවින් එම ඉඩම් කොටස වෙනුවට වලව්ව පිහිටි ඉඩම් කොටස සභාවට පවරා ගෙන එම වලව්ව  අනාගත පරපුර වෙනුවෙන් සංස්කෘතික උරුමයක් ලෙසදායාද කිරීමට කටයුතු කරන්නේ නම් සුදුසු බව පැවසීය.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා අදහස් දැක්වීම.**</u>

5 කණුව නිකේතනය අසළ මාර්ගයේ සුසාන භූමිය අසළ වීථි ලාම්පුවක් යොදා නොමැති බව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය පැවසුවද එම ප්‍රජාශාලාව අසළ අක්‍රිය වී තිබූ වීථි ලාම්පුව වෙනුවට වීථි ලාම්පුවක් සවි කළ බවත් නව වීථි ලාම්පු සවි කිරීම බිබිල ප්‍රාදේශීය සභාව නවතා ඇති බැවින් සුසාන භූමිය ඉදිරිපිටට ම දැමීමට නොහැකි වී ඇති බවත් මේ වන විට පේරගස්පිටිය මාර්ගය ගමන් කළ නොහැකි ආකාරයටම අබලන් වී ඇති බවත් මෙම ප්‍රදේශයේ විශාල වශයෙන් ලෙඩුන් සිටින බැවින් ඒ අය රෝහල් වෙත ගෙන ඒමට 1990 රථයට වත් යාමටවත් නොහැකි බවත් එබැවින් මෙම මාර්ගය ඒ පිළිබඳව ප්‍රමුඛතාවය ලබාදී ප්‍රතිසංස්කරණය කළයුතු බවත් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මේ වන විට පළාත් සභාව වෙත දැනුවත් කර තිබෙන බවත් ප්‍රතිපාදන ලැබුණු විගස මෙම කටයුත්ත සිදු කරන බව පැවසීය.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය  මැතිතුමා වැරදි අවබෝධයක සිටින බව පැවසූ අතර මීට පෙර මෙම සභාව නියෝජනය කළ සියළු සභාපතිවරුන් හට ආදාහනාගාරය විවෘත කිරීමේ උත්සවය සඳහා ආරාධනා කළ බවත් සභාවේ සියළු මන්ත්‍රීවරු ඒ සඳහා සහභාගී වූ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා මෙතෙක් ආරම්භ කිරීමට නොහැකිව තිබූ ආදාහනාගාරය සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලය ,නිළධාරි මණ්ඩලය හා සේවක මණ්ඩලය එක්ව කඩිනමින් විවෘත කිරීමට කටයුතු කළ බවත් කුහක අදහසකින් කටයුතු කර නොමැති බවත් මීට පෙර තිබූ සභා වාරයේදී රදලියද්ද ආදාහනාගාර පැතිබැම්ම පිළිබඳ සැලසුම් කළකාර්මික නිළධාරි පිළිබඳව විමර්ශනයක් කරන ලෙස පවසා ඇති බවත් එබැවින් ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය  මැතිතුමාගේ වැරදි අවබෝධය නැති කර ගන්නා ලෙසද පැවසීය.

<u>**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් දැක්වීම.**</u>

ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව සිදුකළ බවත් ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය වාද විවාද බෙදීම් මෙම ප්‍රාදේශීය සභාව තුළද පැවතීම පිළිබඳව අකමැත්ත ප්‍රකාශ කළද මෙම ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු සියළු දෙනා විවිධ පක්ෂවල නියෝජිතයින් බැවිනුත් කොට්ඨාස 40ම නියෝජනය කරන බැවිනුත් ඒ අය විවිධ මතිමතාන්තර දරණ බැවිනුත් යෝජනාවක් සඳහා තීරණ ගැනීමේදී විවිධ මත ඉදිරිපත් කිරීමට සිදුවන  බවයි. එකම පක්ෂයක නියෝජිතයින් නම් වාද විවාද නොකර තීරණ ගැනීමට හැකි බව පැවසීය.

මේ වනවිට ජාතික ජනබලවේගය මගින් බලය තහවුරු කරගෙන ඇති ප්‍රාදේශීය සභා කිහිපයකම 2026 වර්ෂයේ අයවැය පරාද වී ඇත්තේ විවිධ පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරු සිටින බැවින් බවත් කෙසේ වුවද බිබිල ප්‍රාදේශිය සභාවේ බහුතර බලය ජාතික ජනබලවේග පක්ෂයට ඇති බැවින් එසේ නොවූ බවත් පැවසීය. මෙම විපක්ෂ මන්ත්‍රීවරු 8 දෙනාම යහපත් තීරණ සඳහා සහයෝගය ලබාදීමට කටයුතු කරන බවද පැවසීය.

වසම් තුළ වැඩ කිරීමේදී මේ වනවිට බිබිල ප්‍රාදේශීය සභාවේ බලය තහවුරු කරගෙන සිටින ජාතික ජනබලවේග මන්ත්‍රීවරුන්ට ප්‍රමුඛත්වය ලබාදී කටයුතු කරන බවත් ප්‍රදේශයේ තමන් විසින් වැඩ කරන බව පෙන්වමින් ඊළඟ මැතිවරණය සඳහා සූදානම් වීමට පෞද්ගලික ප්‍රතිරූපය වර්ධනය කර ගැනීමට වැඩ නොකරන බවත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සමඟ එක්ව සාමූහිකව කටයුතු කරන බවත් පැවසීය.

ප්‍රාදේශීය සභාව තුළ වාද විවාද බෙදීම් අවශ්‍ය බවත් වැරදි තීරණ ගන්නා අවස්ථාවල ඒ සඳහා විපක්ෂ වන බවත් හොඳ තීරණ ගැනීමේදී සහයෝගය ලබාදීමට විපක්ෂ මන්ත්‍රීවරු කටයුතු කරන බවත් පැවසීය. එක් එක් මන්ත්‍රීවරුන්ට තමන්ටම කියා පක්ෂයක් පවතින බවත් ඒ සඳහා කැපවී කටයුතු කර ඇති බවත් ඉදිරියටද කටයුතු කරන බවත් නමුත් මෙම ප්‍රාදේශීය සභාව තුළදී සාමූහිකව විනිවිද භාවයකින් කටයුතු කිරීමට බැඳී සිටින බවත් පැවසීය.

**<u>ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

දිට්වා සුළි කුණාටුවෙන් නිල්ගල කොට්ඨාසයේ සිදුවී ඇති ව්‍යසනයන් පිළිබඳ ව ඉදිරි සභා වාරයේදී ඉදිරිපත් කරන බවත් මෙම ව්‍යසනයෙන් විපතට පත් ජනතාවට නිල්ගල කොට්ඨාසයේ පුවක්පැලේ ආශ්‍රිතව ඉඩම් ලබාදීමට කටයුතු කරනනේ නම් සුදුසු බවත් පැවසීය. 2020 වර්ෂයේදී බිබිල ප්‍රාදේශීය සභාවේ වත්කම් පිළිබඳ සකස් කර ඇති අත්පොතක් ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා සතුව පවතින බවත් එවැනි පොතක් මුද්‍රණය කර ගරු මන්ත්‍රී මණ්ඩලයට ලබාදීමට සුදුසු බව පැවසීය.

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් වැඩි පිරිසක් දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් ප්‍රදේශවලට ගොස් සහයෝගය ලබාදී ඇති බවත් තමාට ඒ සඳහා සහභාගිවීමට නොහැකි වූයේ තමා හට සන්නිවේදන සබදතා නොමැති වූ නිසා බැවින් බවත් දෙසැම්බර් 18 වන දින තමාද මෙම විපතට පත් ප්‍රදේශවලට යන බවත් ඒ සඳහා සහභාගිවීමට කැමති මන්ත්‍රී මණ්ඩලයට සහභාගිවන ලෙසත් ඉල්ලා සිටි අතර මීට පෙර සංවර්ධන කටයුතු සිදු කිරීමේදී මුලින්ම නිල්ගල වසමට තමා ඉල්ලා සිටියද මෙවන් ඛේදවාචකයක් සිදුවී තිබියදී තම වසමේ සිදුවී ඇති හානි එතරම් විශාල ඒවා නොවන බැවින් ප්‍රමුඛතාව ඉල්ලා නොසිටින බවයි.ඉදිරියේ දී තම වසමේ සිදුවී ඇති හානි දැනුම් දෙන බවත් ඒවා යථාතත්වයට පත්කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙසද ඉල්ලා සිටියේය.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා අදහස් දැක්වීම.</u>**

බිබිල ප්‍රාදේශීය සභාවේ පහත මාලයේ ඇති වෙළඳසැල් ඉදිරිපිට වැසි සමයේදී ජලය පිරී ඇති බවත් එම ජලය බැස යාමට ඇති ස්ථාන උස් ස්ථානවල පවතින බවත් මේ පිළිබඳව ප්‍රාදේශීය සභාවට මීට පෙර දැනුවත් කර ඇති බවත් එම ජලය බැස යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය අදහස් දැක්වීම.</u>**

දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත්වූ ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කළ අතර තමා විසින් ලබා දී ඇති යෝජනා කිහිපයක්ම මේ වන විට ක්‍රියාත්මක කර ඇති බවත් තමන් ඉදිරිපත් කර ඇති තවත් සංවර්ධන යෝජනා කිහිපයක් පවතින බවත් ඒවා ඉටු කරන ලෙසත් උඩුබුබුල ප්‍රදේශයේ පානීය ජල ගැටලුවක් පවතින බවත් එම ගැටලුව නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසද ඉල්ලා සිටින ලදී.

**<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

ආපදා තත්වයට පත්වී ඇති පාසලක් හඳුනාගෙන දෙසැම්බර් 22 දිනෙන් පසු මන්ත්‍රී මණ්ඩලයේ 18 දෙනාම එක්ව එම පාසලට ගොස් පවිත්‍ර කිරීම් කටයුතු සිදු කිරීමට සුදුසු බවත් ඒ සඳහා සියළු දෙනාට ආරාධානා කරන බවත් පැවසීය.

**<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කළ අතර එම විපතට පත් බදුල්ල මහියංගන ප්‍රදේශ වලට තමන්ද මන්ත්‍රී මණ්ඩලයේ කිහිප දෙනෙකු හා බිබිල ප්‍රදේශයේ ජනතාවද කණ්ඩායම් වශයෙන් ගොස් උදව් උපකාර කළ බව පැවසූ අතර මේ අවස්ථාවේ ජාතීන් වශයෙන් නැගී සිටි බව ප්‍රකාශ කරන ලදී.

පක්ෂ විපක්ෂ ලෙස අප සියළු දෙනා අතරේ මතවාද පැවතුනද සියලු දෙනාම අතර පෞද්ගලික හිතවත්කම් පවතින බවත් ජාතික ජනබලවේග පක්ෂයේ ඇත්තේ අත්හැරීම පෙරටු කරගෙන රට ගොඩනැගීමේ බලාපොරොත්තුවක් බවත් ඒ සඳහා හොඳ සංවිධාන ජාලයක් පවතින සාමූහික විශ්වාසයක් පවතින පක්ෂයක් බවයි. අනෙකුත් සියලු පක්ෂ පිළිබඳව විවේචනය නොකරන බවත් තමා සිතනු ලබන්නේ තම පක්ෂයේ පවතින්නේ අනෙකුත් පක්ෂ වලට වලට වඩා හොඳ තීන්දු තීරණ ගනු ලබන ශක්තිමත් සාමූහික ජාලයක් බවයි. පක්ෂ විපක්ෂ ලෙස විවාද විවේචන තිබියයුතු බවත් යෝජනා සඳහා හොඳම තීරණ ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් පැවසීය.

තමන් මෙම දේශපාලන ව්‍යාපාරයට එක්ව ඇත්තේ සමාජ අසාධාරණය, වංචා, දූෂණ වලින් පිරී ආර්ථිකමය වශයෙන් බිඳවැටුණු රට ගොඩගෙන අනාගත දරු පරපුර වෙනුවෙන් රටක් බිහිකිරීමේ පරමාර්ථයෙන් බවත් තමාගේ පරපුර රැක ගැනීම සඳහා නොවන බවත් එබැවින් මෙම මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාම එක්ව රට සංවර්ධනය කරමින් ජනතාවගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට සාමූහිකව කටයුතු කරමු යැයිද වෙනත් දේශපාලන පක්ෂයක් මෙම රටෙහි පාලනය ලබා ගන්නේ නම් තම පක්ෂයේ තීන්දු තීරණ වලට වඩා හොඳ පක්ෂයක් වියයුතු බවත් එසේ ගන්නේ නම් කිසිඳු අකමැත්තක් නොමැති බවත් සැමදා මන්ත්‍රීවරයෙකු ලෙස වැජඹීමට පැමිණ නැති බවත් පැවසීය.
ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් දෙහිගලවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලුම් කර සිටි බවත් එම මාර්ගය ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා මිලියන 50ක ඇස්තමේන්තු සකස් කර ඇති බවත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බවත් 2026 වර්ෂය සඳහා විශාල සංවර්ධන සැලසුම් ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර ඇති බවත් ඒ සඳහා සාමූහිකව ක්‍රියා කරමු යැයිද පවසන ලදී.
ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා සභා ගර්භයට පැමිණෙන ලදී.

<u>**ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.**</u>

දිට්වා සුළි කුණාටුව නිසා විපතට පත්වූ ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කළ අතර තමාද පසුගිය දිනවල මහියංගන , බදුල්ල ප්‍රදේශයට ගොස් එම ජනතාවගේ සුවදුක් විමසා බැලූ බවත් එම ප්‍රදේශ පවිත්‍ර කිරීම් කටයුතු වලට සහභාගිවී තමාට හැකි පමණින් සහයෝගය දැක්වූ බව ප්‍රකාශ කරන ලදී.

<u>**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා අදහස් දැක්වීම.**</u>

දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම 2025.12.23 වන දින මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන බවත් ඒ සඳහා අත්‍යාවශ්‍ය කාරණා සාකච්ඡා කිරීමට ඇත්නම් පක්ෂ ,විපක්ෂ මන්ත්‍රීවරු තිදෙනෙකුටද සහභාගිවිය හැකි බවත් අත්‍යාවශ්‍යම නම් ගරු උප සභාපතිතුමාටද සහභාගි විය හැකි බවත් පැවසීය.

2026 අයවැය වාර්තාව සකස් කර ගරු මන්ත්‍රීතුමන්ලා අතට පත් කර ඇති බවත් මෙහි මන්ත්‍රී මණ්ඩලයේ ඡායාරූප අනුපිළිවෙල පිළිබඳ ගැටලුවක් තිබේ නම් ඒ පිළිබඳවත් වෙනස් කළයුතු දෙයක් තිබේ නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මේ වනවිට මුද්‍රණය සඳහා ලබාදී නොමැති බැවින් ඒවා නිවැරදි කළ හැකි බවත් දන්වා සිටින ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා වැරදි අවබෝධයක සිටින බව පැවසූ ගරු මූලාසනය බිබිල ප්‍රාදේශිය සභාවේ හිටපු සභාපතිවරුන්ගෙන් එක් සභාපතිවරයෙකුට හැර අනෙකුත් සියලුම සභාපතිවරුන්ට රදලියැද්ද සමුදුන් මැදුර ආදාහනාගාරයේ විවෘතය සඳහා ආරාධනා කළ බව

පැවසූ අතර හිටපු සභාපති ජී.ජී. රංජන් සිල්වා සභාපතිතුමාට සමරු පලකය විවෘත කිරීමටද ආරාධනා කළ බවද පැවසීය.
ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් සංවර්ධනය කිරීමට පැවසූ සමහර මාර්ග ප්‍රාදේශීය සභා මාර්ග වලට අයත් නොවන මාර්ග බව පැවසීය. බිබිල ප්‍රදේශයේ සිදු කරන ලද සමහර සංවර්ධනය කිරීම් පිළිබඳ ව ප්‍රාදේශීය සභාව දැනුවත් නොකර නාස්තිකාර සංවර්ධනය කිරීම් සිදුකර ඇති බවත් 2026 වර්ෂයේදී පළාත් සභාව මගින් සිදුකරනු ලබන නාස්තිකාර සංවර්ධන යෝජනා නතර කිරීමට වැඩ කටයුතු කරමින් සිටින බව ගරු මූලාසනය විසින් පවසන ලදී. එවැනි සංවර්ධනය කිරීමකට උදාහරණයක් ලෙස බදුලු පාරේ 36 කණුවේ කුඹුරු යායේ සකස්කල කොන්ක්‍රීට් ඇල පෙන්වා දෙන ලදී.

දිට්වා සුළි කුණාටුව පිළිබඳව රජය පෙරාතුව දැන සිට මේ පිළිබඳව ක්‍රියාමාර්ග නොගත්තේ යැයි රජයට විශාල විරෝධතාවයක් විපක්ෂය විසින් එල්ල කරන බව පැවසූ ගරු මූලාසනය තමන්ගේ අසනීප තත්වය නිසා මෙම විපතට පත්වූ ප්‍රදේශ වලට ගොස් උදවු උපකාර කිරීමට නොහැකි වුවත් මන්ත්‍රී මණ්ඩලයේ අනෙකුත් මන්ත්‍රීවරු උදවු උපකාර කළ බවත් පිරිස් එක්රැස් කර දීම, වාහන සැපයීම ආදියෙන් තමන්ට හැකි පමණින් උදව් කළ බවත් සුනාමි ව්‍යසන අවසථාවේදී තමා විශාල සහයෝගයක් ලබා දුන් බවත් පැවසීය.

බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා ,බිබිල පොලිස් ස්ථානාධිපතිතුමා හා තමන් එක්ව තම කාර්ය මණ්ඩලය කාර්යක්ෂමව මෙහෙයවමින් ආපදා තත්වය කළමණාකරනය කිරීම සඳහා මැදිහත්ව කටයුතු කළ බව පැවසීය. මෙම කාර්යයන් සිදු කිරීමේදී යම් යම් අඩුපාඩුකම් සිදුවුවද පෙර පැවති පාලන සමයන්ට සාපේක්ෂව සිදුවූ අඩුපාඩු අවම බවත පැවසූ අතර මේ වනවිට රටෙහි සිදුවූ මෙම කඩා වැටීම යථා තත්වයට පත් කරමින් සිටින බවත් විශාල පාලම් කිහිපයක් ,දුම්රිය මාර්ග කිහිපයක් ඉදිකිරීමට ටික කලක් ගත වන බවත් පැවසූ අතර මෙම ආණ්ඩුව රට යථා තත්වයට පත් කිරීමේ ක්‍රියා මාර්ගයේදී ක්ෂණිකව ක්‍රියා කිරිමට සමත්ව ඇති බවත් සම්පූර්ණ වශයෙන්ම රට යථා තත්වයට පත් කිරීමට කිසියම් කාලයක් ගත වන බවත් පැවසීය.

මෙම ව්‍යසන තත්වයට පත්වන අවස්ථාවෙහි ප්‍රාදේශීය සභාවක් ලෙස බිබිල ප්‍රාදේශීය සභාවෙහි මන්ත්‍රී මණ්ඩලය , නිළධාරි මණ්ඩලය ,සේවක මණ්ඩලය විශාල සහයෝගයක් ලබාදුන් අතර රජය විසින් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස නම් කර තිබුණු අවස්ථාවේ ,හදිසි නීතිය ක්‍රියාත්මක අවස්ථාවේදී වුවද සහයෝගය ලබා නොදුන් දුරකතනයටවත් ප්‍රතිචාර නොදැක්වූ කණ්ඩායමක්ද සිටි බව පැවසීය. මෙම ක්‍රියාදාමය සඳහා සයයෝගය ලබාදුන් සියළු දෙනාටම ස්තූතියද පුද කරන ලදී. මෙම ආපදා තත්වය කළමණාකරණය කිරීමේදී පක්ෂ විපක්ෂ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු , පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ,සමාජ ක්‍රියාකාරීන් , රාජ්‍ය නිළධාරීන්, විවිධ රටවල් ,විදේශීයින්, ශ්‍රී ලාංකිකයින් විශාල සහයෝගයක් ලබාදුන් බවද පැවසීය.

දෙසැම්බර් 25 දින යෙදෙන ක්‍රිස්තියානි බැතිමතුන්ගේ නත්තල් උත්සවය වෙනුවෙන් සුභ පැතූ අතර 2026 වර්ෂයේ මහ සභාව රැස්වීමට සිදුවන්නේ තෛපොංගල් දිනට පසුව බැවින් ද්‍රවිඩ බැතිමතුන්ටද සුභ තෛපොංගල් දිනකට සුභාශිංසනය කරමින් ලබන්නාවූ 2026 නව වසර මෙම කුණාටුවෙන් සිදුවූ විනාශයෙන් යලි නැගී සිටිය හැකි සුභ නව වසරකට සුභ පැතුම් එක් කරන ලදී.

2025 දෙසැම්බර් මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2026 ජනවාරි මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත ජනවාරි 22 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව දෙසැම්බර් මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,

බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි